සෞඛ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

ர்றஹஜுஹஉ மඉகரஹர்

யதஹඉற ஜுபஉபந்கஹஆ றகஹகடப

Ministry of Health

Sri Lanka Thriposha Ltd.



திரிபோஷ

THRIPOSHA

திரிபோஷ





2019





වාර්ෂික වාර්තාව

ஆண்ட றிக்கை

Annual Report

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
වාර්ෂික වාර්තාව - 2019

පෙළගැස්ම **පිටුව**

1.	අපගේ දැක්ම සහ මෙහෙවර	01 - 02
2.	සභාපතිතුමියගේ පණිවිඩය	03
3.	අධ්‍යක්ෂ මණ්ඩලය	04
4.	සමාගම කෙටියෙන් හඳුනා ගනිමු	05
5.	විගණන හා කළමනාකරන කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු	06
6.	ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය	07
7.	මානව සම්පත් විශ්ලේෂණය	08
8.	සැපයුම්කරුවන් පිළිබඳ විස්තර	09
9.	නිෂ්පාදන තොරතුරු හා අපේක්ෂිත ඉලක්කය	10 - 12
10.	ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ තොරතුරු	13 - 15
11.	අළෙවි අංශය	16 - 17
12.	2019 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහන සහ මුහුනදීමට සිදුවූ අභියෝග	18
13.	2020 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා සහ අවසන් ඉලක්කය	18 - 19
14.	ස්තුතිය	20
15.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	21 - 48
16.	විගණකාධිපති වාර්තාව	49 - 55

අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය ප්‍රජාව

මන්දපෝෂණයෙන් තොර, නිරෝගීමත්,

සෞභාග්‍යමත් සහ අභිමානවත්

ජාතියක් බවට පත් කිරීම

අපගේ මෙහෙවර

සියළු පෝෂණගුණ සපිරි ත්‍රිපෝෂ

අතිරේඛ ආහාරය සෞඛ්‍යාරක්ෂිතව

නිපදවා ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත

නොමිලේ ලබාදෙමින් නිරෝගීමත් ජනතාවක්

බිහිකිරීමේ ජාතික මෙහෙවරට දායකවීම සහ

සමස්ට ශ්‍රී ලාංකේය ප්‍රජාවගේ පෝෂණ

අවශ්‍යතාවය සපුරාලීම සඳහා පෝෂණීය

අතිරේඛ ආහාර වෙළඳපොළට හඳුන්වාදීමත්,

එසේම මෙම සියළුම නිෂ්පාදනයන් සඳහා

ප්‍රධාන අමුද්‍රව්‍ය සැපයුම්කාරක දේශීය

ගොවියා බලගැන්වීමද අරමුණුවේ

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
සභාපතිතුමයගේ පණිවිඩය



සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ පූර්ණ රජය සතු සමාගමක් ලෙස 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සංස්ථාගත කිරීමේදී සංස්ථාවලියේ දක්වා ඇති අරමුණුවලින් ප්‍රධානතම අරමුණ පෝෂණයෙන් සපිරි නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ ජාතික මෙහෙවර ඉටු කිරීම උදෙසා ත්‍රිපෝෂ අතිරේක ආහාරය නිෂ්පාදනය කොට සෞඛ්‍ය සායන මගින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 05ට අඩු, බර අඩු දරුවන් උදෙසා නොමිලේ බෙදා හැරීම සිදු වූ අතර 2019 වසරේ මා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ වැඩ භාරගත් දින සිට මේ දක්වාද එම ඉලක්කය සැපිරීමට හැකි විය.

සංස්ථාවලියේ තවත් එක් ප්‍රධානතම අරමුණක් වූයේ වෙළඳපල වෙත වාණිජ නිෂ්පාදන (Commercial Products) හදුන්වා දී රජය මත යැපෙන ආයතනයක් නොවී ලාභ උපයන රාජ්‍ය ආයතනයක් බවට පත් වීමයි. වෙළඳපොළට හදුන්වාදුන් සුපෝෂ නිෂ්පාදනය මගින් පෙර වර්ෂ වලට සාපේක්ෂව වැඩිම ලාභය ඉපයීමට හැකිවූයේ මෙම වර්ෂයේදීය. ඒ අනුව වසරක් වැනි ඉතා කෙටි කාලයක් තුළ මෙම ජයග්‍රහණ අත්පත් කරගැනීමට හැකි වීම ඉතා සතුටින් ප්‍රකාශ කරමි.

එමෙන්ම ත්‍රිපෝෂ පිට භාවිතයෙන් පෝෂ්‍යදායී බිස්කට් වර්ගයක් නිපදවීම සඳහා අවශ්‍ය යන්ත්‍ර පද්ධතියක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම, ශ්‍රී ලංකාව පුරා බෙදාහැරීමේ කටයුතු ඉතා ක්‍රමවත්ව සහ විධිමත්ව සිදු කිරීමට හැකිවීම, සේවක සුභසාධනය වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණාවරණ ක්‍රමයක් ඇති කිරීම සහ පරිපාලන සහ මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම හදුන්වාදීම සහ ක්‍රියාමාර්ග ගැනීම මෙම වර්ෂයේදී සිදුකරන ලද තවත් ප්‍රමුඛතම කාර්ය්‍යන්වේ

මේ සඳහා අපහට සහයෝගය දැක්වූ අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා, නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ගරු ෆයිසල් කසිම් මැතිතුමා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ගරු වසන්තා පෙරේරා මැතිතුමිය, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මැතිතුමා, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සේවක මණ්ඩලය හා අඛණ්ඩ නිෂ්පාදනයක් උදෙසා නිසිකලට අමුද්‍රව්‍ය සපයන අපගේ සැපයුම්කරුවන් හා අපහට නන් අයුරින් සහය දක්වන සියළු දෙනා ඉතා කෘතඥ පුර්වකව සිහිපත් කරමි.

බී. පී. එස්. ගුණතිලක
සභාපති
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
2019/12/02

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලය - 2019

- සභාපති, බී. පී. එස්. ගුණතිලක මහත්මිය

- අධ්‍යක්ෂ, වෛද්‍ය අනිල් ජාසිංහ මහතා
  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  ප්‍රජා වෛද්‍ය විශේෂඥ
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, නීතිඥ එච්. එම්. චමින්දිකා හේරත් මෙනවිය
  නීති නිළධාරිණී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, තේජා හේරත් මහත්මිය
  ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරිණී
  කාර්මික තාක්ෂණ ආයතනය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
  ළමා රෝග විශේෂඥ
  පානදුර මහ රෝහල

- නිරීක්ෂක, එම්. ටී. ආර්. සී චිත්‍රලතා මහත්මිය
  ප්‍රධාන ගණකාධිකාරී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- තනූජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ත්‍රිපෝෂ ආයතනය කෙටියෙන් හඳුනා ගනිමු

- ලිපිනය - තැ.පෙ. 17, කොළඹ පාර, කපුවත්ත, ජා-ඇල
- දුරකථන - 0112 - 236588
  0112 - 237418
  0112 - 233451
- ෆැක්ස් අංකය - 0112 - 237363
- ඊ-මේල් ලිපිනය - thriposha@gmail.com
- අමාත්‍යාංශය - සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
- ආයතනයේ ස්වභාවය - සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින
  පූර්ණ රාජ්‍ය සමාගමකි
- සමාගම් ලියාපදිංචි අංකය - PB /3873
- ප්‍රධාන නිෂ්පාදනය - නොමිලේ ලබා දෙන පෝෂණ ගුණයෙන් හා සෞඛ්‍යයෙන් පිරිපුන් ත්‍රිපෝෂ අතිරේඛ ආහාරය සහ අලෙවිය සඳහා සුපෝෂ
- ත්‍රිපෝෂ බෙදා හැරීමේ මධ්‍යස්ථාන -
  * දිවයින පුරා ඇති සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන
  * වතු
  * පරිවාස හා ළමා රක්ෂණ මධ්‍යස්ථාන
- සුපෝෂ බෙදාහැරීම - දිවයින පුරා විසිරි සිටින අලෙවි නියෝජිතයින් 47 දෙනෙක් මගින් සුපෝෂ බෙදාහැරීම සිදුකරනු ලැබේ
- බෙදා හරිනු ලබන ආකාරය - දුම්රිය වැගන් හා ලොරි රථ මගින්
- ප්‍රතිලාභීන් -
  * සියලුම ගර්භනී හා කිරිදෙන මව්වරුන්
  * මව්වරුන්
  * පෝෂණ අවශ්‍යතා සහිත ළමුන්
  * ඇතැම් රෝගීන්
- මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව - දශ ලක්ෂය ඉක්මවා ඇත
- බැංකුව - ලංකා බැංකුව
- විගණක - විගණකාධිපති
  ජාතික විගණන කාර්යාලය
  අංක 306/72, පොල්දූව පාර
  බත්තරමුල්ල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
විගණන හා කළමනාකරණ කමිටුව - 2019

- දර්ශන විජේසිරිවර්ධන මහතා
  සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- නිතිඥ එච්. එම්. චමින්දිකා හේරත් මෙනවිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එන්.එන්.කේ. දිවාකර මිය
  නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටුව
  විගණන අධිකාරි - ජාතික විගණන කාර්යාල

- එම්.ටි.ආර්.සි.චිත්‍රලතා මිය
  නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටුව
  ප්‍රධාන ගණකාධිකාරිණී - සෞඛ්‍ය අමාත්‍යාංශය

- ඩී. බී. තරිඳු වාමික මයා
  මූල්‍ය කළමණාකරු - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එල්. පේ. එස්. ප්‍රේමචන්ද්‍ර මහතා
  කැදවුම්කරු - විගණන හා කළමනාකරණ කමිටුව
  අභ්‍යන්තර විගණක - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 100 දක්වා)

- බී. පී. එස්. ගුණතිලක මහත්මිය
  සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- පී. පී. එස්. ආර්. ද සිල්වා
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රසම්පාදන)
- ආර්. ඒ. කේ. ෆොන්සේකා මහත්මිය
  ගණකාධිකාරි
  වෛද්‍ය සැපයුම් ඒකකය

සුළු ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 10 දක්වා)

- වම්පික සල්ගාදු මහතා
  ජ්‍යෙෂ්ඨ කළමණාකරු (මෙහෙයුම්)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- තනුජා ප්‍රියදර්ශනි අල්විස් මහත්මිය
  ජ්‍යෙෂ්ඨ කළමණාකරු (මානව සම්පත් හා නිති)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- ඩී. බී තරිඳු වාමික මහතා
  කළමණාකරු (මූල්‍ය)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය

ඉතිහාසය

1973 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කෙයා සංවිධානය සමග ඇති කරගත් ගිවිසුමක් මත ඇමෙරිකාවෙන් ත්‍රිපෝෂ ආනයනය කර ශ්‍රී ලංකාව තුලදී පැකට් කර ඉලක්කගත ප්‍රතිලාභීන් අතට පත් කරන ලදි.

1979 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවීමෙන් ලංකා දුම්කොළ සමාගමට ත්‍රිපෝෂ වැඩසටහනේ කළමණාකාරිත්වය පවරන ලද අතර 1987 වර්ෂයේදී කෙයා ආයතනය සම්පූර්ණයෙන්ම මෙම වැඩසටහනෙන් ඉවත් වන ලදි. 1987 සිට 2010/09/17 දින දක්වා ලංකා දුම්කොළ සමාගම විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෘජු අධික්ෂණය යටතේ කළමනාකරන කටයුතු පවත්වාගෙන යන ලදි.

රටේ මන්දපෝෂණය තුරන් කරලිමේ ජාතික වැඩසටහන වඩාත් සවිබල ගැන්වීමේ අරමුණින් ත්‍රිපෝෂ වැඩසටහන කැබිනට් මණ්ඩල තීරනයක් මගින් 2010/09/17 වන දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමින් පූර්ණ රජය සතු සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විතව සංස්ථාපනය කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම පූර්ණ වශයෙන් කළමනාකාරිත්වය භාරගෙන කටයුතු කිරීම 2011/01/01 දින සිට ආරම්භ විය.

වර්තමාන ප්‍රගතිය

2010 වර්ෂයේ රජයට පවරා ගන්නා අවස්ථාවේදී ශ්‍රී ලංකාව තුළ ත්‍රිපෝෂ ලැබීමට හිමිකම ඇති සම්පූර්ණ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 928,000ක් විය. මෙම ප්‍රතිලාභීන් සඳහා සම්පූර්ණයෙන් මසකට අවශ්‍ය ත්‍රිපෝෂ සැපයීමට ත්‍රිපෝෂ මෙ.ටො. 1,392ක් නිෂ්පාදනය කළ යුතු විය. නමුත් මාසික නිෂ්පාදනය මෙ.ටො. 725ක් වූ අතර එය සමස්ථ අවශ්‍යතාවයෙන් 52% කි.

2019 වර්ෂයේ සමස්ථ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,077,243ක් වන අතර මසකට අවශ්‍ය කරන ත්‍රිපෝෂ ප්‍රමාණය මෙ.ටොන් 1,615කි. මාසික නිෂ්පාදනය මෙ.ටොන් 976ක් වන අතර එය මුළු අවශ්‍යතාවයෙන් 60%කි.

මෙම වර්ෂයේ නිෂ්පාදනය කරන ලද සුපෝෂ ප්‍රමානය මෙ.ටො. 3,717කි. සුපෝෂ අලෙවි ආදායම රු මිලියන 747ක් වන අතර මින් රු මිලියන 540ක් පිරිවැය ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවා ඇත.

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවා ගණන, තනතුරු හා අනුමත සේවක සංඛ්‍යාව

01	**ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්**		
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)	01	
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නිති)	01	02
02	**මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්**		
	• කළමනාකරු (ඉංජිනේරු හා නිෂ්පාදන සේවා)	01	
	• කළමනාකරු (තත්ත්ව පාලන)	02	
	• කළමනාකරු (මුදල්)	01	
	• කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන)	01	05
03	**කනිෂ්ඨ කළමනාකරුවන්**		
	• බෙදාහැරීමේ නිළධාරි	01	
	• අභ්‍යන්තර විගණක නිළධාරි	01	
	• මුදල් නිළධාරි	01	
	• සැපයීම් නිළධාරි	01	
	• ගබඩා නිළධාරි	01	
	• ගුදම් ගබඩා නිළධාරි	01	
	• නිෂ්පාදන නිළධාරි	03	
	• පරිපාලන නිළධාරි	01	
	• ගිණුම් නිළධාරි	01	
	• ඉංජිනේරු සේවා නිළධාරි	01	12
04	**කළමනාකරණ සහකාර (තාක්ෂණ)**	04	
05	**කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)**	18	
06	**ප්‍රාථමික සේවා**		
	ප්‍රාථමික සේවා (ශිල්පිය)		
	• රියදුරු	07	
	• විදුලි කාර්මික	04	11
	ප්‍රාථමික සේවා (අර්ධ ශිල්පිය)		
	• බොයිලේරුකරුවන්	03	
	• පිටර්වරුන්	03	
	• ලේත් යන්ත්‍රකරුවන්	02	
	• යන්ත්‍ර ක්‍රියාකරු	28	
	• තත්ත්ව පරීක්ෂක	07	
	• ගිනි නිවීමේ උපස්ථායක	01	
	• ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු	02	46
	ප්‍රාථමික සේවා (ශිල්පිය නොවන)		
	• උද්‍යානකරු	02	
	• කම්කරු/කාර්යාල සහායක	02	
	• සාමාන්‍ය කම්කරු	129	
	• කම්කරු පාලිකා	01	134
	එකතුව		232

2019 වර්ෂයේ සැපයුම්කරුවන් පිළිබඳ විස්තර

- **සෝයා බෝංචි**

එස්.ඩි.කේ. යුනයිටඩ් ඇග්‍රිවෙන්චස් (පුද්ගලික) සමාගම නො. 1280/5,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

- **බඩඉරිඟු**

කේ. එස්. ටී. එවර්ග්‍රීන් (පුද්ගලික) සමාගම
නො. 71,
මිගමුව පාර,
කඳාන.

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය
නො. 45,
කිරිමණ්ඩල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

- **කිරි පිටි**

මිල්කෝ (පුද්ගලික) සමාගම
නො: 45,
නාවලපාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

- **ක්‍රාෆ්ට් පෙපර් බෑග්**

අබ්දුල්ලා ඉන්ඩ්‍රස්ට්ක්ස් පැකේජින් (පුද්ගලික) සමාගම
නො: 72, මහ විද්‍යාල මාවත
කොළඹ 13

- **පොලිතින්**

නිවි පීවා ඉන්ඩස්ට්‍රි (පුද්ගලික) සමාගම
නො. 71 - බී,
කාසල් හිල් විදිය
නුවර.

සෙල්මෝ (පුද්ගලික) සමාගම
නො.59/1,
නාරම්පොල පාර,
මොරගල,
දෙකටන.

රැන්ෆ ෆෙක්සිබල් පැකේජින් (පුද්ගලික) සමාගම
ඩී - 01,
කාර්මික ජනපදය,
ඒකල,
ජා ඇල.

- **විටමින්**

ජේ.කේ. ට්‍රේඩිලින්ක් (පුද්ගලික) සමාගම
නො: 44,
තලවතුගොඩ පාර,
පිටකෝට්ටේ.

ඩී.පී.ඔ. ලංකා (පුද්ගලික) සමාගම
නො. 235/2,
හේකිත්ත පාර,
වත්තල.

- **රැලි සහිත පෙට්ටි** (Corrugated Boxes)

එක්ස්පැක් කොරුගේටඩ් කාටන්ස් ප්‍රයිවට් ලිමිටඩ්
නො.79, පට්ටිවල පාර,
ගොනවල,
කැළණිය

- **පොලිතින්**

ටෆ්ලයින් ලිමිටඩ්
නො.188,
හයිලෙවල් පාර,
මිගොඩ

2015 වසරේ සිට 2019 වසර දක්වා නිෂ්පාදනය (මාස්ටර් බෑග්)

මාසය	2015	2016	2017	2018	2019
ජනවාරි	47,901	57,542	56,236	51,069	43,003
පෙබරවාරි	43,679	53,416	48,288	40,351	35,715
මාර්තු	53,206	55,410	58,150	47,969	47,125
අප්‍රේල්	42,176	44,501	46,956	25,720	28,954
මැයි	57,367	52,757	49,432	55,122	38,109
ජූනි	53,393	15,757	40,134	50,268	43,372
ජූලි	61,000	-	48,128	49,042	38,534
අගෝස්තු	57,719	3,060	53,179	40,374	52,835
සැප්තැම්බර්	60,182	38,071	36,295	48,670	47,082
ඔක්තෝම්බර්	62,381	38,806	27,311	50,036	71,004
නොවැම්බර්	60,908	47,392	49,829	47,152	57,490
දෙසැම්බර්	48,633	28,898	30,017	23,703	17,329
මාස්ටර් බෑග්	**648,545**	**435,610**	**543,955**	**529,476**	**520,552**
මෙ. ටොන්	**14,592**	**9,801**	**12,239**	**11,913**	**11,712**

2015 සිට 2019 වසර දක්වා ත්‍රිපෝෂ නිෂ්පාදනය ප්‍රස්ථාරයක් මගින් (මාස්ටර් බෑග්)



2017 අප්‍රේල් මස සිට 2019 වර්ෂය දක්වා සුපෝෂ නිෂ්පාදනය (මෙ.ටොන්)

මාසය/වර්ෂය	2017	2018	2019
ජනවාරි	-	118	267
පෙබරවාරි	-	190	291
මාර්තු	-	296	393
අප්‍රේල්	49	174	142
මැයි	69	112	381
ජූනි	56	261	283
ජූලි	157	277	283
අගෝස්තු	152	229	317
සැප්තැම්බර්	157	265	294
ඔක්තෝබර්	135	300	430
නොවැම්බර්	252	224	321
දෙසැම්බර්	180	161	315
එකතුව	**1,207**	**2,607**	**3,717**

2017 අප්‍රේල් මස සිට 2019 වර්ෂය දක්වා සුපෝෂ නිෂ්පාදනය ප්‍රස්ථාරයක් මගින් (මෙ.ටොන්)



2020 අපේක්ෂිත ඉලක්කය

- නොමිලේ ලබා දෙනු ලබන ත්‍රිපෝෂ සියලුම ප්‍රතිලාභීන්ට ලබාදීමේ 100% ඉලක්කය ජයගැනීම.

- දේශීය ගොවියා තව තවත් සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරිව ඔවුන්ගේ නිෂ්පාදන ගොවි සංවිධාන වෙතින් ත්‍රිපෝෂ ආයතනයට සපයා ගැනීම

- අප සතු සුපෝෂ අළෙවි නියෝජිත ජාලය තවදුරටත් පුළුල් කිරීම.

- නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය කැබිනට් මණ්ඩල තීරණ මගින් මිලදි ගැනීම මගින් අමුද්‍රව්‍ය හිඟයට විසඳුම් ලබාදීම

- නිෂ්පාදන කටයුතු ඉතා කාර්‍යක්ෂමව සහ ඉහල ගුණාත්මක භාවයෙන් සිදු කිරීමට පහත සඳහන් දෑ මිලදි ගැනීමට කටයුතු කිරීම

    - ✓ කර්මාන්ත ශාලාව තුල ස්ථාපිත කිරීමට ආරම්භ කරන ලද වායුසම්කරන පද්ධතියේ වැඩ කටයුතු අවසන් කිරීම

    - ✓ බඩ ඉරිගු සහ සෝයා ගොවි සමාගම් වෙතින් මිලදිගෙන ගබඩා කිරීමට අවශ්‍ය සයිලෝ පද්ධතියක් ස්ථාපිත කිරීම

2020 වර්ෂයේ ත්‍රිපෝෂ නිෂ්පාදනය පහත අයුරින් ඉහළ නැංවීම ආයතනයේ ඒකායන අපේක්ෂාවයි.

මාසය	**ප්‍රමාණය (මෙ. ටොන්)**
ජනවාරි	2,748
පෙබරවාරි	2,424
මාර්තු	2,775
අප්‍රේල්	2,221
මැයි	2,653
ජුනි	2,869
ජුලි	2,761
අගෝස්තු	2,748
සැප්තැම්බර්	2,748
ඔක්තෝබර්	2,734
නොවැම්බර්	2,532
දෙසැම්බර්	2,343
එකතුව	**31,556**

ත්‍රිපෝෂ බෙදා හැරීමේ ක්‍රියාවලිය

ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාව (ජා-ඇල)



බෙදාහැරීමේ කටයුතු කිරීම (ලොරි රථ මගින් හා දුම්රිය වැගන් මගින්)







ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

සෞඛ්‍ය මධ්‍යස්ථාන (සායන)

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය

වතු

ළමා මධ්‍යස්ථාන











ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සිදු කර සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රමානුකූලව බෙදාහැරීම් කටයුතු සිදු කරනු ලැබේ.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ	වතු අධිකාරි	වෙනත්
1. මධ්‍යම පළාත	1. හැටන්	1. හමුදා රෝහල්
2. නැගෙනහිර පළාත	2. මාතලේ	2. පොලිස් රෝහල්
3. උතුරු මැද පළාත	3. කෑගල්ල	3. ලදරු පාසල්
4. වයඹ පළාත	4. මහනුවර	4. නගර සභා
5. උතුරු පළාත	5. කළුතර	5. මීගමුව
6. සබරගමුව පළාත	6. නුවර එළිය	6. කොළඹ
7. දකුණු පළාත	7. මාතර	7. මාතලේ
8. ඌව පළාත	8. බදුල්ල	8. ගාල්ල
9. බස්නාහිර පළාත	9. ගාල්ල	9. නුවර
	10. රත්නපුර	

පරිවාස හා ළමා ආරක්ෂණ අධිකාරි
1. අනුරාධපුරය
2. බත්තරමුල්ල
3. බදුල්ල
4. ගාල්ල
5. යාපනය
6. ත්‍රිකුණාමලය
7. කුරුණෑගල
8. රත්නපුර
9. කෑගල්ල
10. නුවර

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ	
1. අම්පාර	14. මහනුවර
2. අනුරාධපුරය	15. කෑගල්ල
3. බදුල්ල	16. කිලිනොච්චිය
4. මඩකලපුව	17. කුරුණෑගල
5. කොළඹ	18. මාතලේ
6. ගාල්ල	19. මාතර
7. ගම්පහ	20. මන්නාරම
8. හම්බන්තොට	21. මොණරාගල
9. යාපනය	22. නුවර එළිය
10. කල්මුණේ	23. පොළොන්නරුව
11. කළුතර	24. පුත්තලම
12. රත්නපුර	25. වව්නියාව
13. ත්‍රිකුණාමලය	

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ ගණන					
1. අම්පාර	07	10. කල්මුණේ	13	19. මාතර	16
2. අනුරාධපුරය	18	11. කළුතර	13	20. මන්නාරම	03
3. බදුල්ල	15	12. රත්නපුර	17	21. මොණරාගල	11
4. මඩකලපුව	13	13. ත්‍රිකුණාමලය	10	22. නුවර එළිය	11
5. කොළඹ	11	14. මහනුවර	21	23. පොළොන්නරුව	07
6. ගාල්ල	19	15. කෑගල්ල	11	24. පුත්තලම	11
7. ගම්පහ	16	16. කිලිනොච්චිය	04	25. වව්නියාව	04
8. හම්බන්තොට	12	17. කුරුණෑගල	23		
9. යාපනය	11	18. මාතලේ	12		

2019 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදා හැරීමේ තොරතුරු

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2019	2019 වර්ෂයේ බෙදාහරින ලද ත්‍රිපෝෂ මාස්ටර් බෑග් ප්‍රමාණය
අම්පාර	26,115	11,173
අනුරාධපුරය	54,570	23,146
බදුල්ල	41,070	13,609
මඩකලපුව	53,175	17,725
කොළඹ	67,590	44,327
ගාල්ල	45,675	18,117
ගම්පහ	55,770	31,044
හම්බන්තොට	37,125	23,776
යාපනය	23,115	9,336
කල්මුණේ	49,260	16,489
කළුතර	38,775	21,237
මහනුවර	67,920	27,870
කෑගල්ල	29,355	20,112
කිලිනොච්චිය	6,525	3,312
කුරුණෑගල	77,430	30,128
මන්නාරම	8,145	5,693
මාතලේ	29,685	11,755
මාතර	52,605	23,577
මොණරාගල	28,365	11,135
මුලතිව්	5,040	3,945
නුවරඑළිය	62,700	27,504
පොළොන්නරුව	41,805	15,546
පුත්තලම	30,960	21,285
රත්නපුර	47,670	31,857
ත්‍රිකුණාමලය	27,015	10,370
වව්නියාව	10,440	4,176
වතු	31,384	22,165
පරිවාස හා ළමාරක්ෂණ අධිකාරි	23,849	18,394
ළය රෝහල්	4,410	2,936
එකතුව	**1,077,243**	**521,742**

අලෙවි අංශය

01. අලෙවි අංශයේ ආරම්භය

“රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වන වෙනත් අනුමත පෝෂ්‍ය පදාර්ථයන් නිපදවීම සහ අලෙවිකරණය“ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම පිහිටු වීමේ තවත් එක් පරමාර්ථයකි. මෙම පරමාර්ථය යථාර්තයක් කරමින් 2016 වර්ෂයේ දී නව යන්ත්‍ර සූත්‍ර ස්ථාපිත කිරීම නිසා නිපදවන ලද අතිරික්ත ත්‍රිපෝෂ නිෂ්පාදනය “සුපෝෂ“ නමින් වෙළඳපොලට හඳුන්වාදීමට 2017 වර්ෂයේදී කටයුතු කරන ලදි.

02. අලෙවි අංශය ආරම්භ කිරීමේ අරමුණ

රාජ්‍ය ආයතන යනු අලාභ ලබන ආයතනය යන මිත්‍යා මතයට අභියෝග කරමින් රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොවි ස්වාධිනව උපයාගත් ආදායම මත යැපෙන ලාභ උපයන රාජ්‍ය ආයතනයක් වීම.

03. අලෙවි අංශයේ විකාශනය

මෙම සුපෝෂ නිෂ්පාදනය ග්‍රෑම් 100, ග්‍රෑම් 250, ග්‍රෑම් 500 සහ ග්‍රෑම් 750 යන බ්‍රාණ්ඩ 04 යටතේ අලෙවි නියෝජිතයින් 06 දෙනෙකු මගින් මහනුවර, කළුතර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මුලින්ම වෙළඳපොළට හඳුන්වාදෙන ලදි.

2019 වර්ෂය අවසන් වන විට 47 දෙනෙකුගෙන් සමන් විත අලෙවි නියෝජිත ජාලයක් මගින් දිවයිනේ දිස්ත්‍රික්ක 11ක් ආවරණය කිරීමට හැකි වී ඇත. මීට අමතරව ත්‍රිපෝෂ සමාගම් පරිශ්‍රය තුල සුපෝෂ සහ හයිලන්ඩ් නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි කුටියක්ද විවෘත කරන ලදි.

2019 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වියදම් ප්‍රතිපූරණය කරගැනීම සහ සුපෝෂ ඇතුළු අනෙකුත් නිෂ්පාදන අලෙවියෙන් උපයාගන්නා ලද ආදායම රු මිලියන 3,262ක් වන අතර බදු පෙර ශුද්ධ ලාභය රු මිලියන 178කි.

2019 වර්ෂයේ සුපෝෂ අලෙවි ආදායම

මාසය	වටිනාකම (රු දහස්)
ජනවාරි	37,025
පෙබරවාරි	51,403
මාර්තු	71,580
අප්‍රේල්	39,366
මැයි	53,280
ජුනි	54,785
ජූලි	61,044
අගෝස්තු	69,838
සැප්තැම්බර්	63,893
ඔක්තෝබර්	91,294
නොවැම්බර්	72,901
දෙසැම්බර්	80,136
මුළු අලෙවි ආදායම	**746,546**



2019 වර්ෂය තුළ අත්කරගත් ජයග්‍රහණ සහ මුහුන දිමට සිදුවූ අභියෝග

2019 වසරේ අප ලද ජයග්‍රහන

01. සුපෝෂ අලෙවි නියෝජිත ජාලය 47 දක්වා වැඩි කරගැනිම. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ සුපෝෂ අලෙවි ආදායම 42.76% කින් වැඩි කරගැනිමට හැකි විය. ඒ අනුව ප්‍රවර්ථන වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු මිලියන 78 සිට රු මිලියන 178 දක්වා වැඩිකරගැනිමට හැකි විය.

02. ත්‍රිපෝෂ පිට භාවිතයෙන් පෝෂ්‍යදායී බිස්කට් වර්ගයක් නිපදවීම සඳහා අවශ්‍ය යන්ත්‍ර පද්ධතියක් ජපානයේ Soken Tech Co. Ltd සමාගමෙන් මිලදී ගැනිම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම

03. රු. මිලියන 27.50ක් වැයකර නව රියදුරු විවේකාගාරයක් සහ වාහන නවතා තැබීමට රථගාලක් ඉදිකිරීම

04. රු. මිලියන 18.78ක් වැයකර නව ඇසුරුම් යන්ත්‍ර 02ක් මිලදී ගැනිම

2019 වසරේ මුහුන දිමට සිදුවූ අභියෝග

01 ඉතා දිගු කාලයක් කේෂ්ත්‍රයේ රැඳි සිටීමින් සන්නාමයන් සහිතව වෙළඳ පොළ තුල ඒකාධිකාරයක් ස්ථාපිත කරගෙන ඇති ආයතන සමග තරගකාරිත්වයට මුහුන දිමට සිදු වීම. නමුත් ඉහල තරගකාරිත්වය හමුවේ ත්‍රිපෝෂ සන්නාමය සමග සුපෝෂ ප්‍රචාරන කටයුතු සිදු කිරීම නිසා වෙළඳ පොළ සහ පාරිභෝගිකයා රදවා තබාගැනිමට හැකිවේ.

02 මෙම කර්මාන්තයේ ඇති මහා පරිමාන ආයතන විවිධ ප්‍රචාරන මාධ්‍යයන් යොදා ගනිමින් තම නිෂ්පාදනයන් සඳහා ඉහල ප්‍රචාරනයක් ලබාදිම

03 සිමාකාරී සාධක හේතුවෙන් ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදිමට නොහැකි වීම

2020 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

01. පාරිභෝගික අවශ්‍යතාවය 100% සම්පූර්ණ කිරීමට නිෂ්පාදනය සඳහා අවශ්‍යය අමුද්‍රව්‍ය අඛන්ඩව මිලදි ගැනිම.

02. අමුද්‍රව්‍ය හිඟ කාලවලදීද නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය අමුද්‍රව්‍ය ගබඩා කර තබාගැනිම අවශ්‍ය ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම. මේ සඳහා මෙ.ටොන් 4000 ප්‍රමානයේ සයිලෝ දෙකක් ඉදිකිරීම.

03. ත්‍රිපෝෂ සමාගම සඳහා වාර්ෂික අයවැයෙන් වෙන්කරනු ලබන ප්‍රතිපාදන වැඩි කිරීම.

04. අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් මගින් සුපෝෂ නව නිෂ්පාදනය පාරිභෝගිකයින් අතර වඩාත් ප්‍රචලිත කිරීම හා වෙළඳ පොළට හඳුන්වාදීම.

05. අළෙවි නියෝජිත ජාලය මුළු දිවයිනම ආවරණය වන පරිදි වඩාත් පුළුල් කිරීම.

06. අවසන් නිෂ්පාදනය නියමිත ප්‍රතිලාභියා ලබාදීම සඳහා බෙදාහැරීමේ කටයුතු විදිමත් හා කාර්යක්ෂම කිරීම

අවසන් ඉලක්කය

රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොවී ස්වාධිනව උපයාගත් ආදායම මත යැපෙන රාජ්‍ය ආයතනයක් වීම අපගේ අවසන් ඉලක්කය වේ.

ස්තුතිය...!!!

අප දිරිමත් කරමින් නිරතුරු අපට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සෞඛ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාට, අපට නිරතුරු අවශ්‍ය සහය ලබා දුන් නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ගරු ෆයිසල් කසිම් මැතිතුමාට, අප නිසි මගට යොමු කරමින් උපදෙස් ලබා දුන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ගරු වසන්තා පෙරේරා මැතිතුමිය සහ අපට වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අතහිත දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මැතිතුමාට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

එලෙසින්ම ආයතනයේ කළමනාකාරීත්වය දරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශිර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධුරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම ඉමහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගය කළ යුතුය. අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනීමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සමස්ත කාර්ය මණ්ඩලයට ජයග්‍රහණයේ ප්‍රණාමය පුදකර සිටිමු.



ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	31/12/2019 රු. ශත	31/12/2018 රු.
ආදායම			
අයභාරය	02	3,271,379,657.40	2,806,718,130
අඩු කළා : භාවිතයට සූදානම් නිෂ්පාදනවල පිරිවැය	03	(2,470,824,588.09)	(2,230,761,256)
විකුණුම් පිරිවැය	04	(546,683,677.24)	(424,567,750)
		253,871,392.07	**151,389,124**
වෙනත් ආදායම්	05	50,441,659.25	37,813,850
අඩු කළා : වියදම්			
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	06	22,243,384.71	19,710,986
පරිපාලන වියදම්	07	102,800,346.85	80,045,635
මූල්‍ය සහ වෙනත් වියදම්	08	1,134,223.04	10,805,380
		126,177,954.60	**110,562,001**
වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම		**178,135,096.72**	**78,640,973**

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 27 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතු ය.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	31/12/2019 රු. ශත	31/12/2018 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ	12	671,709,769.14	655,757,870
අස්පෘශ්‍ය වත්කම්	13	-	165,297
		671,709,769.14	**655,923,167**
කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ	14	-	22,513,629
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	15	178,860,757.36	127,134,727
වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත	16	186,986,741.79	212,780,368
මුදල් හා මුදල් සමාන දෑ	17	487,882,034.93	335,266,293
		853,729,534.08	**675,181,389**
මුළු වත්කම්		**1,525,439,303.22**	**1,353,618,185**
කොටස් හිමිකම් හා බැරකම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	18	304,600,000.00	-
විලම්බිත වගකීම්	19	250,562,775.50	390,085,608
ප්‍රත්‍යාගණන සංචිත	20	131,176,703.11	306,378,658
වියදම ඉක්මවූ සමුච්චිත ආදායම		600,524,514.63	422,306,485
මුළු කොටස් හිමිකම්		**1,286,863,993.24**	**1,118,770,750**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	21	53,309,803.83	44,898,532
වෛද්‍යාධාර අරමුදල	22	246,836.57	209,447
		53,556,640.40	**45,107,979**
ජංගම බැරකම්			
වෙළඳ සහ වෙනත් ගෙවීම් නියමිත	23	185,018,669.58	189,739,456
මුළු කොටස් හිමිකම් හා බැරකම්		**1,525,439,303.22**	**1,353,618,185**

ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉතා වැදගත් අංගයක් සුසාදනය කරන පිටු අංක 6 සිට 27 දක්වා ගෙන හැර ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශවලට කරන ලද සටහන් හා සමග සංයෝජිතව කියවිය යුතු වන්නේ ය.

2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත.

.....

මූල්‍ය ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

මණ්ඩලය වෙනුවෙන් සහ ඒ උදෙසා අනුමත කර අත්සන් කරන ලදී.

.....	.....
සභාපති	**අධ්‍යක්ෂ**

ජා ඇල, කපුවත්ත.
දිනය : 27/02/2020

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
කොටස් හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	ප්‍රකාශිත ප්‍රාග්ධනය		ප්‍රාග්ධන සංචිත		ප්‍රත්‍යාගණන සංචිත		වියදම් ඉක්මවූ සමුච්චිත ආදායම		එකතුව	
		රු.	ශත	රු.	ශත	රු.	ශත	රු.	ශත	රු.	ශත
2018.01.01 දිනට ශේෂය				395,491,067.02		306,378,657.65		343,665,512.04		1,045,535,236.71	
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන				50,974,042.59		-		-		50,974,042.59	
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් අදාළ ක්ෂය වීම්				(56,379,502.03)		-		-		(56,379,502.03)	
2018 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම				-		-		78,640,973.06		78,640,973.06	
2018.12.31 දිනට ශේෂය			-	**390,085,607.58**		**306,378,657.65**		**422,306,485.10**		**1,118,770,750.33**	
2019.01.01 දිනට ශේෂය			-	390,085,607.58		306,378,657.65		422,306,485.10		1,118,770,750.33	
ගැළපුම්	18	304,600,000.00		(129,574,367.55)		(175,025,632.45)		-		-	
එකතු කිරීම් / අඩු කිරීම් - 2019			-	49,916,074.87		(176,322.09)		-		49,739,752.78	
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් අදාළ ක්ෂය වීම්	19		-	(59,864,539.38)		-		-		(59,864,539.38)	
පූර්ව වර්ෂයේ ගැළපුම්	24		-	-		-		82,932.81		82,932.81	
2019 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම			-	-		-		178,135,096.72		178,135,096.72	
2019.12.31 දිනට ශේෂය		**304,600,000.00**		**250,562,775.52**		**131,176,703.11**		**600,524,514.63**		**1,286,863,993.26**	

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2019 රු.	31/12/2018 රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම	178,135,097	78,640,973
ගැළපුම්		
ක්ෂය වීම්	61,971,983	57,664,125
ව්‍යපහරණ අලාභ	-	10,639,533
රඳවා ගැනීමේ බදු	277,251	-
පොලි ආදායම	(14,433,406)	-
වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන	14,827,855	5,663,671
වෛද්‍යාධාර දායකත්වය සඳහා ප්‍රතිපාදන	208,740	231,068
පූර්ව වර්ෂ ගැළපුම්	(1,420,800)	-
	61,431,623	**74,198,397**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**239,566,719**	**152,839,370**
කාරක ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම්		
ණය ගැතියෝ සහ වෙනත් ලැබීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	25,793,626	(63,429,775)
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	(4,720,786)	58,913,620
වට්ටෝරු භාණ්ඩ වැඩිවීම / (අඩුවීම)	(51,726,030)	72,948,513
	(30,653,190)	**68,432,358**
මෙහෙයුම් කටයුතු වලින් උත්පාදිත මුදල්	**208,913,530**	**221,271,728**
අඩු කළා : ගෙවන ලද පාරිතෝෂික	(6,416,584)	(3,721,918)
වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම්	(171,350)	(198,044)
මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**202,325,596**	**217,351,767**
ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම	(77,758,585)	(55,024,828)
කෙටි කාලීන් ආයෝජනයන්හි කළ ආයෝජන	(125,000,000)	-
කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ	22,513,629	(22,513,629)
ලද පොලි	7,642,613	642,143
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**(172,602,343)**	**(76,896,315)**
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	(10,124,787)	(5,405,459)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	19,598,466	135,049,992
මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන එන ලදී	183,342,473	200,216,301
මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන යන ලදී	**202,940,940**	**335,266,293**
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ හි විශ්ලේෂණය		
අතැති මුදල්	-	20,000
ලංකා බැංකුව, ජා-ඇල - ගිණුම් අංකය 71324617	16,524,816	29,691,455
ලංකා බැංකුව, ජා-ඇල - ගිණුම් අංකය 80306903	186,416,124	153,631,019
භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජන	-	92,580,625
ස්ථාවර තැන්පතු මත ආයෝජන	-	59,343,195
	202,940,940	**335,266,293**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

නිෂ්පාදන ගිණුම
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	31/12/2019 රු. ශත	31/12/2018 රු.
නිෂ්පාදන පිරිවැය			
අමු ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය			
2019.01.01 දිනට ශේෂය		88,411,099.24	146,784,459
මිලදී ගැනිම්	09	2,065,207,867.92	1,813,404,373
		2,153,618,967.16	1,960,188,832
වට්ටෝරු භාණ්ඩ හානිය		(291,031.60)	-
2019.12.31 දිනට ශේෂය	15	(117,286,466.32)	(88,411,099)
පරිභෝජනය කළ අමුද්‍රව්‍යවල පිරිවැය		**2,036,041,469.24**	**1,871,777,733**
සෘජු ශ්‍රම හා කළමනාකරණ පිරිවැය	10	213,981,333.10	187,261,755
කම්හල් පොදුකාර්ය වියදම්	11	205,377,938.96	162,148,537
ප්‍රති සැකසුම් අලාභය		-	(112,656)
මූලික පිරිවැය		**2,455,400,741.30**	**2,221,075,368**
කෙරෙමින් පවත්නා වැඩ			
2019.01.01 දිනට ශේෂය		12,605,572.55	2,388,929
2019.12.31 දිනට ශේෂය	15	(2,192,397.76)	(12,605,573)
		10,413,174.79	(10,216,643)
මුළු නිෂ්පාදන පිරිවැය		**2,465,813,916.09**	**2,210,858,725**

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

2019 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත සමාගමකි. සමාගමේ ලියා පදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, ජා ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ‘‘ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන’’ සඳහා ‘‘ත්‍රිපෝෂ’’ නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම සමාගමයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුළ මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්ති වර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන ‘‘ත්‍රිපෝෂ’’ වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවීන් හැකි තාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්තිවර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා පවතින වෙළඳපොළ අවම කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1. බී.පී.එස්. ගුණතිලක මහත්මිය (සභාපතිනි)
2. වෛද්‍ය අනිල් ජාසිංහ මහතා
3. වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
4. එච්. එම්. තේජා හේරත් මහත්මිය
5. චමින්දිකා හේරත් මහත්මිය
6. වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
7. සාගරිකා බෝගහවත්ත මහත්මිය
8. ටී. ආර්. සී. චිත්‍රලතා මහත්මිය (නිරීක්ෂක)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

තනූජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය

1.1.4 විගණක

ජාතික විගණන කාර්යාලය

අංක 306 / 72, පොල්දුව පාර,

බත්තරමුල්ල.

1.1.5 බැංකුකරුවන්

ලංකා බැංකුව,

ජා ඇල.

1.1.6 නිකුත් කිරීම සඳහා බලය ලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවට අනුවණී 2019 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී"

1.1.7 සකස් කිරීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත" සාධාරණ අගය මත ගැනෙන වටිනාකම්න් මනිනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් හැර ඓතිහාසික පිරිවැය සම්මුත27යය ටතේ මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත" ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ" සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ඒවා යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය සිය විනිශ්චයමතිය ක්‍රියාවට නැංවීමේ ද අවශ්‍ය වන්නේ ය" ඉහළ මට්ටමේ විනිශ්චයමතියක් අදාළ වන හෝ සංකීර්ණතාවයක් ඇතිවන ක්ෂේත්‍ර හෝ සමාගමේ මූල්‍ය ප්‍රකාශ සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කරනු ලැබ ඇත"

අ" අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්තින්ණී පදනම් සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශයණී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයණී සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි වරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවය"

ආ" නිර්ණය කිරීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ අගය සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හි දී හැරණී මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත"

ඇ" සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේ සහ අන්තර් කාල සීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්ණී එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ගුණාත්මකණී විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ"

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිණී වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවක දී හැරුණු කොටණී මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල සීමාවන් සඳහා අඛණ්ඩව අදාළ කරගනු ලැබ ඇත"

මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවක දීණී මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත"

ඈ" කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ වලංගු මුදල

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ"

ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මඟින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල භාවිතය හා වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පූර්ව නිගමනවලට එළඹීම අපේක්ෂා කෙරේ. තථ්‍ය ප්‍රතිඵල, මෙම ඇස්තමේන්තු වලින් සහ යොදා ගන්නා ලද නිගමනවලින් වෙනස් විය හැකි ය.

ඇස්තමේන්තු සහ පාදක කර ගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාල සීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාල සීමාව සහ අනාගත කාල සීමාවන් තුළදී ය.

ඊ. ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

නුදුරු අනාගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම නොකඩවා පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සැහිමට පත් වෙමින්, ඒ අනුව, සමාගම ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාමේ උපකල්පනය නුදුරු අනාගත කාල සීමාව තුළ නොකඩවා යොදාගත හැකි බවට ද සහතික වෙයි.

1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්

1.2.1 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ

අ. හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ සහ වෙනත් යම් දුබලතා අලාභ යටතේ දක්වා ඇත.

සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ සහ යම් දුබලතා අලාභ යටතේ වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. දේපළ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුළ ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ආ. පිරිවැය

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස සෘජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, ඳිර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන පසු කාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ යක එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසු කාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉඳිරි ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවති නම් සහ එහි පිරිවැය යථාර්ථවාදී ලෙස ගණනය කළ හැකි නම් පමණි.

ඇ. ප්‍රත්‍යාගණනය කිරීම

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය සතු සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කරන ලදී. (සියලු දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ 2019 වර්ෂයේ අග භාගයේ දී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නැවත ඇගයීමට ලක් කරන ලදී. ඒ සම්බන්ධ වාර්තා ලැබීමට අපේක්ෂිතව පවතී.)

ඇ. ක්ෂය කිරීම්

වත්කමිහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය මත එම වත්කමිහි පිරිවැය ඉවත් කිරීම පිණිස, පහත සඳහන් වටිනාකම් යටතේ සරල මාර්ග පදනම (straight-line basis) මත වාර්ෂිකව, ප්‍රාග්ධන සංචිතය වෙත ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

ගොඩනැගිලි	අවුරුදු 20 ට වැඩි
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 10 ට වැඩි
මෝටර්	අවුරුදු 05 ට වැඩි
උපකරණ හා මෙවලම්	අවුරුදු 05 ට වැඩි
විද්‍යාගාර උපකරණ	අවුරුදු 10 ට වැඩි
කෘෂිකාර්මික උපකරණ	අවුරුදු 10 ට වැඩි
විදුලි වැඩ	අවුරුදු 05 ට වැඩි
කාර්යාල උපකරණ	අවුරුදු 10 ට වැඩි
ලී බඩු සහ සවි කිරීම්	අවුරුදු 10 ට වැඩි
පරිගණක උපකරණ	අවුරුදු 04 ට වැඩි
අස්පෘශ්‍ය වත්කම්	අවුරුදු 04 ට වැඩි

ඉ. හඳුනා නොගැනීම

බැහැර කරන විට දී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවක දී, දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් හඳුනා නොගනු ලැබූ සේ සැලකේ. වත්කම් හඳුනා නොගැනීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම හඳුනා නොගැනීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කරනු ලැබේ.

1.2.2 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ

කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය වීමට ඇති ගොඩනැගිලි ඉදි කිරීමේ දී සෘජුවම හට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේ දී, අදාළ දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ. එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක වීමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේ දී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථාවේ දී ය. කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ, යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ණය ගැනුම් පිරිවැය ඇතුළත්ව, ගත් මිලට දක්වනු ලැබේ.

1.2.3 අස්පෘශ්‍ය වත්කම්

වත්කම වෙත ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 අස්පෘශ්‍ය වත්කම්හි පරිදි වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවතී නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ගත් මිලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සරල මාර්ග ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත.

වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සරල මාර්ග ක්‍රමය මත විෂය මාලා පරිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය ලියා අස්කර තිබේ.

1.2.4 වට්ටෝරු භාණ්ඩ ලේඛන

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි ඉඩ ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ වට්ටෝරු භාණ්ඩ ලේඛන ඇගයීම පළමුව පැමිණ පළමුව පිටවන පදනම **(FIFO)** මත සිදු කරනු ලැබේ. ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

වට්ටෝරු භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේදී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම් ගත කරනු ලැබේ : -

අමු ද්‍රව්‍ය	-	ගත් මිලට
කෙරෙමින් පවතින වැඩ	-	ගත් මිලට
නිම කළ භාණ්ඩ	-	සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය යටතේ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම්ව ස්ථිර නිෂ්පාදිතයේ යෝග්‍ය සමානුපාතිකයක් සඳහා වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබයි.

ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන ඇස්තමේන්තු ගත විකුණුම් මිලයි.

1.2.5 වත්කම් දුබලතාවයට පත්වීම

දුබලතාවයට පත්වීම පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ප්‍රවාහන පිරිවැය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. දුබලතාවයට අලාභයක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ප්‍රවාහන පිරිවැය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, දුබලතා අලාභය නැවත හරවාලනු ලැබේ.

1.2.6 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, වලදායී සීමාවක් තුළ සීමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදී ම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනා ගනු ලබන්නේ, ගණුදෙනු පිරිවැය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවක දී ය.

සමාගම විසින්, ඔවුන් සිය සමාගම ස්ථාපිත කළ දිනයේ සිට ණය, ලැබිය යුතු සහ තැන්පතු හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනා ගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේ දී ය.

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ලබන අතර, එමඟින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් කපා හැරීමක් වන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ එම ශුද්ධ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුළ මුදල්, කෙටි කාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුළ වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාල සීමාව තුළදී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම් ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුළ හඳුනා ගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් වර්ගීකරණය කර නොමැත.

ආ. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, භායන අඩු කර ඵලදායී පොලි අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කරගැනීම මත ලද වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලි අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. ඵලදායී පොලි අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමාන දෑ ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

ඇ. කල් පිරීමට නියමිත ආයෝජන

ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳී ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, දුබලතා ඌණ ඵලදායී පොලි අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ අගයනු ලැබේ. ඵලදායී පොලි අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

රජයේ සුරැකුම් පත් සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

ඇ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුළ වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, විකිණීමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම හා එහි වෙනස්කම් අනුව අගයනු ලබන අතර, දුබලතා අලාභ හැර වෙනත් විස්තිර්ණ ආදායම් තුළ හඳුනා ගනු ලබන අතර, අරමුදල් සහ සංචිත වල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉඳිරිපත් කරනු ලැබේ. විකිණීමට හැකි ණය සුරකුම් මත පොලි ආදායම ඵලදායී පොලි අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. යම් ආයෝජනයක් හඳුනා ගනු නොලැබූ විට, අරමුදල් හා සංචිත තුළ සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස හඳුනා ගනු ලැබ නොමැත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මූල්‍ය උපකරණ

මූල්‍ය මෙවලම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 වෙනුවට මූල්‍ය මෙවලම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 ආදේශ වේ : වර්ගීකරණය සහ මානනය කිරීම, දුබලත්වයට පත්වීම වීම සහ ප්‍රාවිකරණ (හෙජ්) ගිණුම්කරණය යන මූල්‍ය මෙවලම් සඳහා වූ අංශත්‍රයම එකට ගෙන එමින් 2018 ජනවාරි මස 1 වන දිනයට හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා හඳුනා ගැනීම සහ මානනය කිරීම.
සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 සම්මත කර ගත්තේ සම්පූර්ණ අතීතානුසාරී ක්‍රමය භාවිතා කරමිනි. සිදු කරන ලද තක්සේරුව මත පදනම්ව, සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 විශාල බලපෑමක් ඇති නොකරන බව සමාගම නිගමනය කර ඇත.

වර්ගීකරණය සහ මානනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 යටතේ, වෙළඳ ලැබිය යුතු මුදල් හැර, සමාගම ආරම්භක අවස්ථාවේ දී මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ එහි සාධාරණ අගයට ය. ඊට අමතරව මානනයක් සිදු කෙරෙනුයේ, ලාභ හෝ අලාභ සහ ගනුදෙනු පිරිවැය හරහා සාධාරණ අගය මත ගණනය නොවූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙනි.
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 යටතේ, ණය මූල්‍ය මෙවලම්, ලාභ හෝ අලාභය හරහා සාධාරණ අගයක් මතත්, ක්‍රමක්ෂය කළ පිරිවැය හෝ වෙනත් විස්තිරණ ආදායම හරහා වූ සාධාරණ අගයක් මතත් පසු අවස්ථාවක දී මනිනු ලැබේ. මෙම වර්ගීකරණය, නිර්ණායක දෙකක් මත පදනම් වේ. එනම්, වත්කම් කළමනාකරණය සඳහා වූ සමාගමේ ව්‍යාපාර ආකෘතිය මත: සහ මෙවලම්වල කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහයන්, පරිශේෂව ඇති ‘‘මුල් මුදල මත මුල් මුදල හා පොලි මුදල පමණක් වූ ගෙවීම්’’ නියෝජනය කරන්නේ ද යන්න මත.
2018 ජනවාරි මස 1 වන දින මූලික අයදුම් කිරීමේ දිනය වන විට ආයතනයේ ව්‍යාපාර ආකෘති තක්සේරුව සිදු කරන ලද අතර, පසුව, එය, 2018 ජනවාරි මස 1 වන දිනට පෙර හඳුනා නොගත් මූල්‍ය වත්කම් සඳහා අතීතයට ද බලපාන පරිදි යොදන ලදී. ණය මෙවලම් මත කොන්ත්‍රාත් ගත මුදල් ප්‍රවාහයන්හි තක්සේරු කිරීම, හුදෙක් මූලික මුදල හා පොලි මුදල්වලින් පමණක් සමන්විත වන්නේ ද යන්න පදනම් වූයේ, වත්කම්වල ආරම්භක හඳුනා ගැනීමේ දී ඇති කරුණු සහ තත්වයන් මත ය.

සමාගමේ මූල්‍ය වගකීම් සඳහා වූ ගිණුම්කරණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පැවති ආකාරයටම බොහෝ දුරට පවතී.

1.2.7 මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට හරයාත්මක සාක්ෂි පවතිදැයි අගයනු ලබන අතර, එවැනි දුබලත්වයක් සිදු වී ඇත්නම්, එම දුබල වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තු ගත ඉඳිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 සම්මත කිරීම මගින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 තුළ පැවති සිදු වූ අලාභ ආශ්‍රිත ප්‍රවේශය වෙනුවට ඉඳිරි දැක්මක් සහිත අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් ප්‍රතිස්ථාපනය වීමෙන් මූල්‍ය වත්කම් සඳහා වූ දුබලතා අලාභ පිළිබඳ සමාගමේ ගිණුම්කරණය මූලික වශයෙන් වෙනස් කරනු ලැබ ඇත.

සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් වෙනුවෙන් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය මත පවත්වා නොගැනෙන අපේක්ෂිත ණය අලාභ සඳහා යම් ඉඩ හැරීමක් සටහන් කර තැබීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 නියම කරයි.

අපේක්ෂිත ණය අලාභ පදනම් වනුයේ, කොන්ත්‍රාත්තුවට අනුව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ ආයතනය වෙත ලැබෙතැයි අපේක්ෂා කරන සියලුම මුදල් ප්‍රවාහ අතර වෙනස මත ය. කිසියම් අඩුවක් ඇත්නම්, එය, වත්කම්වල මුල් ඵලදායී පොලි අනුපාතයට ආසන්න වන පරිදි පසුව වට්ටම් කරනු ලැබේ.

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රමිතයේ සරල ප්‍රවේශය ආයතනය විසින් යොදා ගගනු ලැබිය යුතු අතර අපේක්ෂිත ණය අලාභ, ඒවායේ ආයු කාලය තුළ අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව ගණනය කළ යුතු වන්නේ ය.

1.2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

අතැති මුදල්, බැංකු තැන්පතු, ස්ථාවර තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සාම්‍යයන් සමන්විත වේ.

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුළ ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වත්කම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, දත් සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනීය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේ දී, ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

1.3.1 සේවක ප්‍රතිලාභ

අ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ගිණුම්කරණ 19 යන සේවක ප්‍රතිලාභල ප්‍රමිතය සමාගම විසින් අනුගමනය කරනු ලැබ ඇති අතර සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමට විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදු කිරීම සඳහා ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතා කර ඇත.
මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික පූර්ව නිගමන තුළ පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ :

වට්ටම් අනුපාතය	12%
ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම	02%
විශ්‍රාම ගැනීමේ වයස	අවුරුදු 55

සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

ආ. නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වටිනාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් හිමි නොවනු ඇත. නිශ්චිත දායකත්ව සැලැස්ම සඳහා වන දායකත්ව වෙනුවෙන් වන වගකීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ ඒවා නියමිත වන්නා වූ අවස්ථාවන්හි දී, එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ඇ. සේවක අර්ථසාධක අරමුදල

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙළින්, 12% හා 8% බැගින් වන පරිදි, 2019 වර්ෂයේ ජූලි මාසය දක්වා සිය දායකත්වය අනුමත කරන ලද අර්ථසාධක අරමුදල වෙත සලසා දෙනු ලැබේ.

ඇ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් වූ ප්‍රමාණයක් අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ගත් මිල මත සඳහන් කරනු ලැබේ

1.3.3 බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මගින් 2018.04.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුව විසින් පනවන ලද ආදායම් බදු මීට අයත් වේ. පනතට යෝජිත වෙනස්කම් ක්‍රියාත්මක කිරීම මගින් අර්ථ දැක්වෙනුයේ, ඒකාබද්ධ අරමුදලින් පාර්ලිමේන්තුව විසින් වැය ශීර්ෂ ගත කරන ලද අරමුදලින් හෝ රජය මගින් පිළියෙළ කර දෙන ලද ඕනෑම ණය මුදලකින් යම් රාජ්‍ය සංස්ථාවකට ලැබෙන මොනයම් හෝ මුදලක් 2018.04.01 වන දිනට හෝ ඉන් පසුව ආදායම් බද්දෙන් නිදහස් කළ යුතු බවයි. තවදුරටත්, අංක 1.7 වන සටහන වෙත යොමු වන්න.

1.3.4 විලම්බිත බදුකරණය

සමාගමේ අතිරික්තය සහ ආදායම, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව ආදායම් බදු වලින් නිදහස් කර ඇති හෙයින්, විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන සම්පාදනය කර නැත.

1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම් ය.

මූල්‍ය ප්‍රකාශවලට සිදු කරන අදාළ සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ප්‍රාග්ධන සංචිතය (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව)

වර්ෂ 2011 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලවි කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාළ ක්ෂය කිරීම් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

1.4.1 ප්‍රදාන

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යාකොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතික වීමක් පවතින අවස්ථාවකදී රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

සමාගම තුළ ඇති කෙරෙනු ලබන වියදම් වෙනුවෙන් ඒ වෙත පිරිනමනු ලබන ප්‍රදාන, එම වියදම් හඳුනා ගනු ලබන වර්ෂයේ ම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ. යම් වත්කමක පිරිවැය සඳහා සමාගම වෙත ලබා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

1.4.2 වියදම්

අ. දරන ලද පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර සෘජු සබඳතාව මත පදනම්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල දී සහ කාර්යක්ෂම අවස්ථාවන්හි දී ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී ඇති වන සියලුම වියදම්, එම වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම්හි ප්‍රතිපාර්ශ්වය ලෙස අය කරගනු ලැබ ඇත.

1.4.3 මූල්‍ය වියදම් / ආදායම්

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය 07 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

1.6 වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ සිදුවීම්

වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපුම් හෝ අනාවරණ අවශ්‍ය වන්නාවූ සැලකිය යුතු සිදුවීම් කිසිවක් නොමැත.

1.7 නව ගිණුම්කරණ ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථකථන

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, 2018 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන නව ප්‍රමිතීන් අනුගමනය කිරීමට හැර, පෙර මූල්‍ය වර්ෂය තුළ සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ. දැනටමත් නිකුත් කරනු ලැබ ඇති නමුත් මේ දක්වා බලාත්මක නොවන වෙනත් යම් ප්‍රමිතියක්, අර්ථකථනයක් හෝ සංශෝධනයක් සමාගම විසින් සම්මත කර ගනු ලැබ නොමැත.

(i) "මූල්‍ය මෙවලම් : හඳුනා ගැනීම සහ මානනය කිරීම" යන ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 39 දරන ප්‍රමිතියෙහි බහු වර්ගීකරණ සහ මිනුම් ආකෘතින් වෙනුවට මූලින් වර්ගීකරණ කාණ්ඩ දෙකක් පමණක්, එනම්, ක්‍රමක්ෂගත පිරිවැය සහ සාධාරණ අගය යනුවෙන් පැවති තනි මාදිලියක් සහිත ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 9 යන "මූල්‍ය මෙවලම්" ප්‍රමිතිය ප්‍රතිස්ථාපනය වේ.

(ii) භාණ්ඩ හා සේවා සඳහා වන කොන්ත්‍රාත්තු ආවරණය කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 18 සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ආවරණය කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 11 වෙනුවට "ගනුදෙනුකාර භවතුන් සමග ගිවිසුම්වලින් ලැබෙන ආදායම" යන ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 15 දරන ප්‍රමිතිය ආදේශ වන්නේ ය. නව ප්‍රමිතිය පදනම් වී ඇත්තේ, භාණ්ඩයක හෝ සේවාවක පාලනය ගනුදෙනුකරුවකු වෙත පවරනු ලබන විට ආදායම හඳුනා ගැනීම යන මූලධර්මය මත ය. එබැවින් පාලනය පිළිබඳ සංකල්පය දැනට පවතින අවදානම් සහ ත්‍යාග පිළිබඳ සංකල්පය ප්‍රතිස්ථාපනය කරයි.

(iii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 1, එනම්, 'ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රථම වරට අනුගමනය කිරීම', ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 7, එනම්, 'මූල්‍ය මෙවලම් හෙළිදරව් කිරීම්' සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 19, එනම්, 'සේවක ප්‍රතිලාභ' සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 10, එනම්, 'ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ' සඳහා සිදු කරන ලද තව දුරටත් අදාළ නොවන සංශෝධන මගින් සංක්‍රාන්ති විධිවිධාන ආවරණය කරමින් අදාළ කෙටි කාලීන නිදහස් කිරීම් ඒ හරහා කපා හරියි

(iv) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 16 එනම්, "කල් බදු", මූලික වශයෙන් බදුලාභීන් විසින් සිදු කරනු ලබන ගිණුම්කරණයට බලපානු ඇති අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත කල්බදුකර සියල්ලම පාහේ හඳුනා ගැනීමට එය හේතු වනු ඇත. ප්‍රමිතිය මගින් මෙහෙයුම් සහ මූල්‍ය කල්බදු අතර වත්මන් වෙනස ඉවත් කරන අතර වත්කමක් (කල් බදු දෙන ලද අයිතමය භාවිතා කිරීමේ අයිතිය) හඳුනා ගැනීමත්, අත්‍යන්ත වශයෙන් සියලුම කල්බදු කොන්ත්‍රාත්තු සඳහා කුලී ගෙවීම හා සම්බන්ධ මූල්‍ය වගකීමත් එමගින් අවශ්‍ය වේ. කෙටි කාලීන සහ අඩු වටිනාකමින් යුත් කල්බදු සඳහා විකල්ප නිදහස් කිරීම් පවති.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 16 මගින් කල්බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා වන මූලධර්ම ගෙන හැර දක්වා ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17 යටතේ, 'අඩු වටිනාකමක්' සහිත සහ මාස 12 හෝ ඊට අඩු බදු කාල සීමාවක් සහිත කෙටි කාලීන කල්බදු සඳහා වන නිදහස් කිරීම් කිපයක් හැර, මූල්‍ය කල්බදු සඳහා වූ ගිණුම්කරණයට සමාන තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල්බදු සඳහා බදුලාභීන් විසින් ගිණුම්ගත කිරීම් සිදු කරනු ලැබීම අවශ්‍ය වන්නේ ය. මෙම ප්‍රමිතිය 2019 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(v) කොටස් ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය මෙවලම් මත ලාභාංශවලින් උද්ගත වන ආදායම් බදු ප්‍රතිවිපාක හඳුනා ගත යුත්තේ, බෙදා හැරිය හැකි ලාභ උත්පාදනය කළ අතීත ගනුදෙනු හෝ සිදුවීම් අනුව හඳුනා ගනු ලැබූ කල්හි බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 වන "ආදායම් බදු" ප්‍රමිතියෙහි සංශෝධන මගින් පැහැදිලි කරයි. අදාළ ප්‍රමිතිය අළලා කළ වැඩිදියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(vi) යම් අදාළ සුදුසුකම් ලැබීමේ වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා හෝ විකිණීම සඳහා සූදානම් වූ පසු කිසියම් නිශ්චිත ණය ගැනීමක් නොගෙවා ශේෂව පවතී නම්, එය සාමාන්‍ය ණය ගැනීම්වල කොටසක් බවට පත් වන බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 වන "ණය ගැනීමේ පිරිවැය" අළලා කරන ලද සංශෝධන මගින් පැහැදිලි කරයි. අදාළ ප්‍රමිතියේ වැඩිදියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන දිනට හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(vii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 3, එනම්, "ව්‍යාපාර සංයෝජිතය" යන්නට කළ සංශෝධන මගින් පැහැදිලි කර ඇත්තේ, ඒකාබද්ධ මෙහෙයුමක් වන ව්‍යාපාරයක පාලනය ලබා ගැනීම අදියර වශයෙන් සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාරික සංයෝජනයක් බවයි. ප්‍රමිතියේ වැඩිදියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12, එනම්, "ආදායම් බදු" හැරුනු විට, ප්‍රකාශිත ප්‍රමිතීන්ට කරන ලද සංශෝධන අනුගමනය කිරීම මගින් සමාගමේ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති වේයැයි අපේක්ෂා නොකෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12, එනම්, "ආදායම් බදු" වල බලපෑම තව දුරටත් තක්සේරු කෙරෙමින් පවතී. එය, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කර එය හරහා සලකා බැලිය යුතු ය. වලදායී නොවන වෙනත් ප්‍රමිතීන් තවමත් නොමැති අතර වත්මන් හෝ අනාගත වාර්තාකරණ කාල පරිච්ඡේදවල දී සහ නුදුරේ දී සිදු විය හැකි අනාගත ගනුදෙනු සඳහා සමාගම කෙරෙහි සුවිශාල බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

1.8 විකිණීම සඳහා තබා ගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මඟින් නැවත ලබා ගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකිණීම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට පූර්ව වහාම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකිණීම සඳහා තබා ගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත හායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසු කාලීන ලාභ හෝ පාඩු, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. කිනම් හෝ සමුච්චිත හායන පාඩුවක් ඉක්මවා ලාභ හඳුනා ගනු නොලැබේ.

1.9 සිමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත විශ්ලේෂණය

ඉලක්ක 2 : ශූන්‍ය කුසගින්න

කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව අත් කර ගැනීම සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

2.1 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

2030 වන විට, කුසගින්න නිමා කර, සියලුම මිනිසුන්ට, විශේෂයෙන්, දුප්පතුන්ට සහ ළදරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි තත්වයන් තුළ සිටින පුද්ගලයින්ට, වසර පුරා ආරක්ෂිත, පෝෂ්‍යදායී සහ ප්‍රමාණවත් ආහාර සඳහා ප්‍රවේශය සහතික වීම.

2.1.1 දර්ශකය

මන්දපෝෂණය පැතිරීම.

2.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

2025 වන විට, වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ වර්ධනය බාලවීම සහ මන්දනය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් එකccs වූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම ඇතුළුව 2030 වන විට, සියලුම ආකාරයේ මන්දපෝෂණය අවසන් කිරීම සහ නව යොවුන් වියේ ගැහැණු ළමයින්, ගර්භනී සහ කිරි දෙන කාන්තාවන් සහ වැඩිහිටි පුද්ගලයින් යන අයවළුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම.

2.2.1 දර්ශකය

වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර වර්ගය අනුව (මන්දනය සහ අධික බර) මන්දපෝෂණය (උස අනුව බර > +2 හෝ < -2 සම්මත අපගමනය - ලෝක සෞඛ්‍යය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතිවල මධ්‍යස්ථය අනුව) පැතිර පැවතීම.

2.3 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

ඉඩම්, අනෙකුත් නිෂ්පාදන සම්පත් සහ යෙදවුම්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපල සහ අගය එකතු කිරීම සහ ගොවිපල නොවන රැකියා සඳහා අවස්ථා යනාදී දෑ හරහා ඒවා වෙත සුරක්ෂිතව හා සමාන ප්‍රවේශයක් ලබා දීම ඇතුළුව 2030 වන විට, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්, ආදි වාසීන්, පවුල් ගොවීන්, එඬේරුන් සහ ධීවරයින් අයගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම දෙගුණ කිරීම.

2.3.1 දර්ශකය

ලිංගිකත්වය සහ දේශීය තත්ත්වය අනුව, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය ආදායම.

ඉලක්ක 9 : කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්

ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම, අන්තර්ගතභාවය සහ තිරසර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

9.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

අන්තර්ගතභාවය හා තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කිරීම සහ 2030 වන විට, ජාතික තත්වයන්ට අනුකූලව, කර්මාන්තයේ රැකියා කොටස සහ දළ දේශීය නිෂ්පාදිතය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ ඌණ සංවර්ධිත රටවල එහි කොටස දෙගුණ කිරීම.

9.2.1 දර්ශකය

- දළ ජාතික නිෂ්පාදිතයේ සහ ඒක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම.
- සමස්ත සේවා නියුක්තියේ ප්‍රතිශතයක් ලෙස රැකියා නිෂ්පාදනය.

9.4 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

2030 වන විට, සියලු රටවල් තම හැකියාවන්ට අනුකූලව ක්‍රියා කරමින් යටිතල පහසුකම් සහ ප්‍රතිනිර්මිත කර්මාන්ත වැඩිදියුණු කිරීම, සම්පත් පරිහරණ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ පිරිසිදු හා පරිසර හිතකාමී තාක්ෂණයන් සහ කාර්මික ක්‍රියාවලින් වැඩි වශයෙන් භාවිතා කිරීම.

9.4.1 දර්ශකය

අගය එකතු කරන ලද ඒකකයකට CO2 විමෝචනය

9.5 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

2030 වන විට නවෝත්පාදන දිරිමත් කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධන වියදම් සඳහා වන පර්යේෂණ හා සංවර්ධන සේවකයින් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම ඇතුළුව, 2030 වන විට, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල, විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම, කාර්මික අංශවල තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම.

9.5.1 **දර්ශකය**

- දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස පර්යේෂණ සහ සංවර්ධන වියදම්.වැඩිදියුණු කිරීම.
- ජනගහනය මිලියනයකට පර්යේෂකයන් (පූර්ණ කාලීනව සමාන)

ඉලක්ක 12 : වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය

තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

12.5 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

2030 වන විට, වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය තුළින් අපද්‍රව්‍ය උත්පාදනය සැලකිය යුතු ලෙස අඩු කිරීම.

12.5.1 දර්ශකය

ජාතික ප්‍රතිචක්‍රීකරණය අනුපාතය, ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍යය ටොන් ගණන.

12.7 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූලව තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

12.7.1 දර්ශකය

තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කරන රටවල් ගණනාවක්.

12 අ. අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය

සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් කරා ගමන් කිරීම සඳහා ඔවුන්ගේ විද්‍යාත්මක හා තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීමට සහාය වීම.

12 අ. 1 දර්ශකය

තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය සහ පාරිසරික වශයෙන් යහපත් තාක්ෂණයන් සඳහා පර්යේෂණ සහ සංවර්ධනය උදෙසා සංවර්ධනය වෙමින් පවතින රටවලට ලැබෙන ආධාර ප්‍රමාණය.

	31/12/2019 රු. ශත	31/12/2018 රු.
02. ආදායම		
අයභාරය	2,441,399,694.98	2,215,278,047
ක්ෂය වීම	59,864,539.38	56,379,502
සුපෝෂ විකුණුම්	746,933,175.80	523,214,501
හයිලන්ඩ් නිෂ්පාදන විකුණුම්	19,222,565.24	10,773,160
ජා.ආ.ප්‍ර.ම. නිෂ්පාදන විකුණුම්	584,232.00	672,070
SDK නිෂ්පාදන විකුණුම්	880,860.00	400,850
බේකරි නිෂ්පාදන	2,494,590.00	-
	3,271,379,657.40	**2,806,718,130**
03. පරිභෝජනයට සුදානම් නිෂ්පාදනවල පිරිවැය		
2019.01.01 දිනට නිමවූ නිෂ්පාදන	5,010,672.00	24,913,203
මුළු නිෂ්පාදන පිරිවැය	2,465,813,916.09	2,210,858,725
2019.12.31 දිනට නිමවූ නිෂ්පාදන	-	(5,010,672)
	2,470,824,588.09	**2,230,761,256**
04. විකුණුම් පිරිවැය		
2019.01.01 දිනට ශේෂය	7,046,999.85	13,650,007
ලැබුණා - සුපෝෂ	539,945,170.17	369,851,071
ගැනුම් - හයිලන්ඩ් නිෂ්පාදන	16,099,652.80	9,146,061
ගැනුම් - ජා.ආ.ප්‍ර.ම. නිෂ්පාදන	459,095.69	539,113
ගැනුම් - SDK නිෂ්පාදන	848,647.60	428,162
ගැනුම් - ඇසුරුම් ද්‍රව්‍ය	-	38,000,336
	564,399,566.11	**431,614,750**
2019.12.31 දිනට ශේෂය	(17,715,888.87)	(7,047,000)
	546,683,677.24	**424,567,750**
05 වෙනත් ආදායම්		
අපතය විකුණුම්	23,849,965.00	22,558,357
නිවාස ණය පොලි	2,121,729.35	1,294,269
භාණ්ඩාගාර බිල්පත් මත පොලි	7,649,201.92	7,012,927
ස්ථාවර තැන්පතු මත පොලි	6,784,204.29	5,130,951
වෙනත්	10,036,558.69	1,817,347
	50,441,659.25	**37,813,850**
06 විකුණුම් හා බෙදාහැරීමේ වියදම්		
ප්‍රවාහන වියදම්	11,138,959.64	14,107,436
අලෙවි සැල වියදම්	2,049,939.23	294,040
මුද්‍රණ හා ප්‍රචාරණ	6,342,990.40	4,005,373
විකුණුම් කොමිස් හා වෙනත් වියදම්	715,628.77	56,137
ක්ෂය වීම	1,995,866.67	1,248,000
	22,243,384.71	**19,710,986**

	31/12/2019 රු. ශත	31/12/2018 රු.
07. පරිපාලන වියදම්		
වැටුප්	10,798,530.64	9,652,305
සේවක අර්ථසාධක අරමුදල	2,231,260.66	2,191,188
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	476,736.30	484,802
අතිකාල දීමනා	3,746,080.70	2,356,408
දීමනා	3,408,984.35	3,709,810
අනියම් වේතන	1,471,233.34	1,032,525
අනියම් වේතන මත සේ.අ.අ.	319,833.34	219,500
අනියම් වේතන මත සේ.නි. භා.අ.	47,975.01	32,925
කළමනාකරණ දීමනා	7,363,082.30	8,366,493
කාර්යමණ්ඩල සුබසාධනය	3,560,591.45	3,050,092
වරිපනම් සහ බදු	381,300.71	518,941
කාර්යාල උපකරණ නඩත්තු	1,410,699.73	900,647
ආරක්ෂක ගාස්තු	8,484,859.30	7,375,734
මෝටර් වාහන ඉන්ධන	3,706,756.75	2,782,471
මෝටර් වාහන අලුත්වැඩියා හා නඩත්තු	3,394,039.91	2,155,378
වෙනත් සේවා හා නඩත්තු	13,500.00	-
ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු	597,345.00	-
තේ සහ වෙනත්	21,455.00	-
රක්ෂණය	2,047,191.43	-
සිද්ධි කළමනාකරණ සේවා	33,078.00	-
ලිපි ද්‍රව්‍ය	1,072,402.53	1,806,302
තැපැල් ගාස්තු	155,000.00	355,000
දුරකථන ගාස්තු	521,406.50	550,013
කාර්යමණ්ඩල පුහුණු කිරීමේ ගාස්තු	22,923,595.30	13,010,300
නෛතික හා වෘත්තිය ගාස්තු	2,082,191.97	882,495
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	1,159,791.65	1,043,117
වෛද්‍ය හා සනිපාරක්ෂක	518,454.99	532,508
ගමන් වියදම්	303,250.00	210,150
ප්‍රදාන	284,475.00	940,000
නිල ඇඳුම් - අලෙවි	27,575.00	88,000
දැරී දීමනා	14,717,471.16	9,723,097
ක්ෂය වීම	5,520,198.83	6,075,434
	102,800,346.85	**80,045,635**
08 මූල්‍ය හා වෙනත් වියදම්		
බැංකු ගාස්තු	1,065,642.79	53,191
වෙනත් වියදම්	68,580.25	-
ව්‍යපහරණ අලාභ	-	10,639,533
ප්‍රති සැකසුම් අලාභ	-	112,656
	1,134,223.04	**10,805,380**

	31/12/2019 රු. ශත	31/12/2018 රු.
09 මිලදී ගැනුම්		
බඩ ඉරිගු	779,898,383.82	714,643,328
සෝයා	757,894,660.95	512,146,729
කිරි පිටි	272,480,000.00	373,102,650
ඛනිජ ලවණ	70,035,225.00	43,207,050
විටමින්	75,700,762.50	80,172,854
පොලිතින් බෑග්	1,258,560.00	7,001,766
පොලිතින් ටීල්	67,634,039.84	50,890,355
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	40,073,145.00	32,006,559
ටිවයින් නූල්	233,090.81	233,082
	2,065,207,867.92	**1,813,404,373**
10 සෘජු ශ්‍රම සහ කළමනාකරණ පිරිවැය		
වැටුප්	70,984,547.94	61,853,762
සේවක අර්ථසාධක අරමුදල	11,995,861.08	9,744,726
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	2,699,368.74	2,434,629
අතිකාල දීමනා	54,507,254.60	48,162,231
දීමනාව	24,509,247.43	28,343,242
පාරිතෝෂික	14,827,855.23	5,663,671
සේවාස්ථ ගෙවීම්	599,263.14	429,854
නිල ඇඳුම් සහ ලොන්ඩරි සේදුම්	4,297,741.87	4,185,069
තේ හා වෙනත්	4,043,282.91	3,906,123
සේවා මුර හා ආහාරපාන දීමනාව	2,777,829.01	2,197,984
වෛද්‍ය හා සනිපාරක්ෂක	1,031,413.02	1,017,482
අනියම් හා කොන්ත්‍රාත් වැටුප්	6,037,647.63	5,576,687
අනියම් හා කොන්ත්‍රාත් වැටුප් මත සේ.අ.අ.	1,036,934.66	878,297
අනියම් හා කොන්ත්‍රාත් වැටුප් මත සේ.නි.භා.අ.	246,502.99	204,391
සුබසාධන වියදම්	233,895.09	205,788
දිරි දීමනා	14,152,687.76	12,457,820
	213,981,333.10	**187,261,755**
11 කම්හල් පොදුකාර්ය පිරිවැය		
විදුලි ජනකය සඳහා ඉන්ධන	49,659,130.00	41,398,428
කම්හල් නඩත්තුව	1,908,747.00	66,046
පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු	43,292,341.99	22,777,451
විද්‍යාගාර වියදම්	3,664,359.73	3,678,311
විදුලිය	35,297,046.89	32,717,280
ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු	4,983,894.09	2,774,122
වෙනත් සේවා හා නඩත්තු	11,624,957.92	8,250,043
උද්‍යාන නඩත්තුව	200,512.50	58,880
හානි හා අලාභ	291,031.60	87,285
ක්ෂය වීම	54,455,917.24	50,340,691
	205,377,938.96	**162,148,537**

12. දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය / ප්‍රත්‍යාගණනය	2018.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	2019.12.31 දිනට ශේෂය
ඉඩම්	220,000,000	-	220,000,000.00
ගොඩනැගිලි	126,987,772	29,313,198.39	156,300,970.45
පිරියත හා උපකරණ	443,660,637	28,423,707.71	472,084,345.14
මෝටර් රථ	30,495,000	11,272,000.00	41,767,000.00
ආම්පන්න හා උපකරණ	7,707,234	949,270.00	8,656,504.05
විද්‍යාගාර උපකරණ	7,976,757	1,669,645.54	9,646,402.41
විදුලි වැඩ	6,042,735	-	6,042,734.76
කාර්යාල උපකරණ	8,553,690	2,299,160.17	10,852,849.92
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	7,601,458	1,677,742.42	9,279,200.75
පරිගණක හා වෙනත් දෘඩාංග	8,274,639	2,153,861.00	10,428,499.88
	867,299,922	**77,758,585.23**	**945,058,507.36**

සමුච්චිත ක්ෂය කිරීම්	2018.12.31 දිනට ශේෂය	වර්ෂය සඳහා අය	2019.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	25,048,973	7,204,356.89	32,253,330.21
පිරියත හා උපකරණ	143,358,357	44,727,229.73	188,085,586.58
මෝටර් රථ	20,418,500	3,785,866.67	24,204,366.67
ආම්පන්න හා උපකරණ	5,607,000	749,903.51	6,356,903.25
විද්‍යාගාර උපකරණ	2,832,503	831,132.15	3,663,635.30
විදුලි වැඩ	3,540,461	989,997.66	4,530,458.96
කාර්යාල උපකරණ	3,362,113	980,381.35	4,342,494.02
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	3,079,945	814,496.85	3,894,442.01
පරිගණක හා වෙනත් දෘඩාංග	4,294,200	1,723,321.03	6,017,521.22
	211,542,052	**61,806,685.84**	**273,348,738.22**

ලියා අඩු කළ අගය	2018.12.31 දිනට ශේෂය	2019.12.31 දිනට ශේෂය
	රු.	රු. ශත
ඉඩම්	220,000,000	220,000,000.00
ගොඩනැගිලි	101,938,799	124,047,640.24
පිරියත හා උපකරණ	300,302,281	283,998,758.56
මෝටර් රථ	10,076,500	17,562,633.33
ආම්පන්න හා උපකරණ	2,100,234	2,299,600.80
විද්‍යාගාර උපකරණ	5,144,254	5,982,767.11
විදුලි වැඩ	2,502,273	1,512,275.80
කාර්යාල උපකරණ	5,191,577	6,510,355.90
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	4,521,513	5,384,758.74
පරිගණක හා වෙනත් දෘඩාංග	3,980,439	4,410,978.66
	655,757,870	**671,709,769.14**

	2019.12.31 දිනට ශේෂය		2018.01.01 දිනට ශේෂය
	රු.	ශත	රු.
13. අස්පෘෂ්‍ය වත්කම්			
පිරිවැය	661,187.57		661,188
සමුච්චිත ක්ෂය කිරීම්	661,187.57		495,891
ලියා අඩු කළ අගය	-		**165,297**
14. කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ			
නාන කාමර ඉදිකිරීම	-		517,145
ගරාජය හා විවේකාගාරය ඉදිකිරීම	-		21,996,484
	-		**22,513,629**

15 වට්ටෝරු භාණ්ඩ	31/12/2019 රු. ශත	31/12/2018 රු.
අමු ද්‍රව්‍ය		
බඩ ඉරිගු	10,541,192.69	16,845,955
සෝයා	71,270,388.00	39,872
කිරි පිටි	4,260,000.00	47,022,150
ඛනිජ ලවණ	10,193,150.00	4,074,650
විටමින්	8,769,468.75	11,471,825
	105,034,199.44	**79,454,452**
ඇසුරුම් ද්‍රව්‍ය		
පොලිතින් බෑග්	-	277,020
පොලිතින් රීල්	2,826,591.88	4,558,059
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	9,425,675.00	4,121,568
	12,252,266.88	**8,956,647**
වෙනත්		
ඩීසල්	2,747,160.00	3,138,130
ඉංජිනේරු ගබඩා තොගය	38,918,844.41	10,922,254
	41,666,004.41	**14,060,384**
කෙරෙමින් පවත්නා වැඩ		
අමු ද්‍රව්‍ය		
බඩ ඉරිගු	1,207,400.00	10,858,791
සෝයා	60,480.00	-
කිරි පිටි	260,000.00	997,500
ඛනිජ ලවණ	65,037.50	72,518
විටමින්	528,281.25	115,041
ඇසුරුම් ද්‍රව්‍ය		
පොලිතින් බෑග්	12,025.80	164,256
පොලිතින් රීල්	55,381.70	155,064
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	3,543.28	242,402
ටිවයින් නූල්	248.23	-
	2,192,397.76	**12,605,573**
නිමි භාණ්ඩ		
ළමා	-	2,927,068
මාතෘ	-	2,083,604
	-	**5,010,672**
අලෙවි අංශය		
සුපෝෂ	274,571.52	856,169
ඇසුරුම් ද්‍රව්‍ය	16,782,678.43	5,846,978
හයිලන්ඩ් නිෂ්පාදන	381,959.74	343,853
කෙරෙමින් පවත්නා වැඩ	276,679.18	-
	17,715,888.87	**7,047,000**
එකතුව	**178,860,757.36**	**127,134,727**

	31/12/2019 රු. ශත	31/12/2018 රු.
16 වෙළඳ හා වෙනත් ලැබීම්		
ණයගැතියෝ	27,625,102.35	146,994,281
ණයගැතියෝ - අලෙවි	45,371,885.34	29,753,237
අත්තිකාරම් සහ පෙර ගෙවීම්	52,564,653.92	181,000
ලැබිය යුතු රක්ෂණ	541,161.14	-
තැන්පතු	2,026,000.00	1,976,000
නිවාස ණය - වත්කම්	35,416,951.11	24,798,514
නිවාස ණය - ආපදා	22,627,037.93	8,630,286
උත්සව අත්තිකාරම්	173,750.00	221,250
විනෝද චාරිකා අත්තිකාරම්	640,200.00	225,800
	186,986,741.79	**212,780,368**

16.1 අත්තිකාරම් සහ පෙර ගෙවීම්		
මධ්‍යම වායුසම්කරන යන්ත්‍රය (මෙට්‍රොපොලිටන් ඉංජිනියරින්)	12,790,683	
නියුට්‍රබාර් නිපැයුම් යන්ත්‍රය 20% (සෝකන් ටෙක් කම්පැනි ලිමිටඩ්)	31,023,790	
ආයතනික සැලැස්ම 2020-2024 - 20% (කේ.පී.එම්.ජී.)	632,500	
ෆ්ලෝ ටයිල් සඳහා අත්තිකාරම් (අබිරු කොන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවේට්) ලිමිටඩ්)	4,838,174	
වෛද්‍යාධාර රක්ෂණය (ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්)	2,866,068	
වෙනත්	413,439	
	52,564,654	

17 මුදල් හා මුදල් සමාන දෑ		
අතැති මුදල්	-	20,000
ලංකා බැංකුව, ජා-ඇල - ගිණුම් අංකය 71324617	16,524,815.53	29,691,455
ලංකා බැංකුව, ජා-ඇල - ගිණුම් අංකය 80306903	186,416,124.04	153,631,019
භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජන	92,587,214.29	92,580,625
ස්ථාවර තැන්පතු මත ආයෝජන	192,353,881.07	59,343,195
	487,882,034.93	**335,266,293**

17.1 භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජන - ප්‍රතිගැනුම් ගිවිසුම

මධ්‍යම තැන්පතු පද්ධති ගිණුම	2019.12.31 දිනට වාහක මුදල	2018.12.31 දිනට වාහක මුදල
RET-Y107471000 - 01	71,587,214.29	71,566,000.00
RET-Y107471000 - 02	21,000,000.00	21,014,625.00
	92,587,214.29	**92,580,625.00**

17.2 ස්ථාවර තැන්පතු මත ආයෝජන

ගිණුම් අංකය	2019.12.31 දිනට වාහක මුදල	2018.12.31 දිනට වාහක මුදල
83258807	6,038,876.91	5,400,000.00
82420963	4,724,582.92	4,211,218.84
81508819	18,062,416.86	16,443,915.36
81048092	4,955,761.57	4,417,199.88
80940675	12,521,967.72	11,056,818.37
80871912	13,811,638.82	12,166,676.55
80586829	6,416,375.99	5,556,330.37
82932526	50,000.00	50,000.00
85235518	125,772,260.27	-
	192,353,881.07	**59,302,159.37**

* ඉහත තැන්පතු ලංකා බැංකුවෙහි ආයෝජනය කර ඇත.

18 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රාග්ධන සංචිත	129,574,367.55	-
ප්‍රත්‍යාගණන සංචිත	175,025,632.45	-
	304,600,000.00	**-**

අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් ලෙස, ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ රජය සතු පොදු සීමිත සමාගමක් වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, රු. 304,600,000/= ක (රුපියල් තුන් මිලියන හයසිය දහසක) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහිතව 2010 සැප්තැම්බර් මස 17 වන දින ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

19 විලම්බිත වගකීම්

වසර ආරම්භයේ ශේෂය	390,085,607.56	375,554,449
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	37,125,391.42	47,609,531
ප්‍රකාශිත ප්‍රාග්ධනය	(129,574,367.55)	-
ප්‍රාග්ධන වත්කම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ අත්තිකාරම්	12,790,683.45	23,301,129
අඩු කළා : වර්ෂය සඳහා ක්ෂය අය කිරීම්	(59,864,539.38)	(56,379,502)
වර්ෂය අවසානයේ ශේෂය	**250,562,775.50**	**390,085,608**

20 ප්‍රත්‍යාගණන සංචිතය

වසර ආරම්භයේ ශේෂය	306,378,657.65	306,378,658
ප්‍රකාශිත ප්‍රාග්ධනය	(175,025,632.45)	-
වත්කම් විකිණීම මත ප්‍රත්‍යාගණන ලාභය/අලාභය	(176,322.09)	-
වර්ෂය අවසානයේ ශේෂය	**131,176,703.11**	**306,378,658**

21 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

වසර ආරම්භයේ ශේෂය	44,898,532.10	42,956,779
අඩු කළා : වර්ෂය තුළ ගෙවීම්	(6,416,583.50)	(3,721,918)
වර්ෂය සඳහා ප්‍රතිපාදන - 2019	14,827,855.23	5,663,671
වර්ෂය අවසානයේ ශේෂය	**53,309,803.83**	**44,898,532**

වට්ටම් ගත අනුපාතය	12%	12%
ඉඳිරි වැටුප් වර්ධක අනුපාතය	10%	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම්	2%	2%
විශ්‍රාම ගැනීමේ වයස	අවුරුදු 55	අවුරුදු 55

	31/12/2019 රු. ශත	31/12/2018 රු.
22 වෛද්‍යාධාර අරමුදල		
වසර ආරම්භයේ ශේෂය	209,446.78	176,422
වර්ෂය තුළ දායකවීම්	208,740.00	231,068
වර්ෂය තුළ ගෙවීම්	(171,350.21)	(198,044)
වර්ෂය අවසානයේ ශේෂය	**246,836.57**	**209,447**
23 නියමිත වෙළෙඳ හා වෙනත් ගෙවීම්		
ණය හිමියන්	69,466,431.65	133,075,718
වැටුප් පාලන ගිණුම	401,669.82	-
උපචිත වියදම්	-	52,133
සෞඛ්‍ය අමාත්‍යාංශය - මුදල් අග්‍රිමය	-	9,776
ගෙවිය යුතු තැන්පතු	57,203,237.50	54,243,238
සෞඛ්‍ය අමාත්‍යාංශය	57,947,330.61	2,358,591
	185,018,669.58	**189,739,456**
24 පූර්ව වර්ෂ ගැළපුම්		
වියදම් ගිණුම්වලට අදාළ ගැළපුම්	82,932.81	-
	82,932.81	**-**

25 ප්‍රාග්ධන ප්‍රදාන හා සම්බන්ධ ක්ෂය කිරීම්

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇති ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය කිරීම්, එම වර්ෂයේ මුළු ක්ෂය අය කිරීම් අඩු කරමින් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට අයගත කරගනු ලැබ ඇත.

26 බැඳියා සහ අවිනිශ්චිතතා

වාර්තා කරනු ලබන දිනයේදී කිසිදු සැලකිය යුතු බැඳියාවක් හෝ අවිනිශ්චිතතාවක් නොපැවතුණි.

27 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් හා පවත්නා ගනුදෙනු

සමාගමෙහි ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් වනුයේ, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ය. 2019 වර්ෂය තුළ, රැස්වීම්වලට සහභාගි වීමේ දීමනා සහ ප්‍රවාහන දීමනා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් සඳහා පිළිවෙලින් රු. 525,000 සහ රු. 138,000 ක මුදලක් ගෙවා ඇත.

28 මූල්‍ය අවදානම් කළමනාකරණය

සමාගම්වල වැඩ කටයුතු පහත දැක්වෙන දෑ වැනි විවිධ මූල්‍ය අවදානම් වලට ඔවුන්ව නිරාවරණය කරවයි.

(අ) වෙළෙඳ පොළ අවදානම (වෙළෙඳ පොළ අවදානම හා විදේශ විනිමය අවදානම ඇතුළුව)

(i) විදේශ විනිමය අවදානම

සමාගම විනිමය අනුපාතවල උච්චාවචනයන්ට සංවේදී වන අතර ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අගය උච්චාවචනයන්ට නිරාවරණය වේ. සමාගමේ ක්‍රියාකාරී මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වන අතර එමගින් බොහෝ ගනුදෙනු සිදු වේ. අනෙකුත් සියලුම ව්‍යවහාර මුදල් වාර්තා කිරීමේ කාර්යයන් සඳහා විදේශ මුදල් ලෙස සැලකේ.

(ii) පොලි අනුපාත අවදානම

පොලි අනුපාත අවදානම යනු, වෙළෙඳ පොළ පොලි අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය මෙවලමක සාධාරණ අගය හෝ අනාගත මුදල් ප්‍රවාහ උච්චාවචනය වීමේ ඇති අවදානමයි. සමාගම තම පොලි අනුපාත අවදානම කළමනාකරණය කරන්නේ, මුදල් ප්‍රවාහ නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමෙන් සහ ණය ගැනීම් සඳහා හිතකර අනුපාත සාකච්ඡා කිරීම මගිනි.

(අ) ණය අවදානම

සමාගම ව්‍යාපාර කටයුතු කරන අතරතුර ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් ලබා දෙයි. එබැවින්, වෙළඳ

ණය නොගෙවීම, වෙළෙඳාමෙන් ලැබිය යුතු මුදල් හා සම්බන්ධයෙන් වූ ප්‍රධාන අවදානමකි.

(ආ) ණය අවදානම් නිරාවරණය

සාමාන්‍යයෙන් ණය අවදානමට යටත් වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් නිරාවරණය, ඒවායේ වාහක මුදලට සමාන වේ. පහත වගුව මගින් උපරිම අවදානම් ස්ථාන ගෙන හැර දක්වයි.

	12/31/2019	12/31/2018
වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත	159,361,639.44	65,786,086.88
සම්බන්ධිත පාර්ශව වෙතින් ලැබිය යුතු මුදල්	27,625,102.35	146,994,281.36
මුදල් හා මුදල් සමාන දෑ	487,882,034.93	335,266,293.23
මුළු ණය අවදානම් නිරාවරණය	**674,868,776.72**	**548,046,661.47**

(ඇ) ද්‍රවශීලතා අවදානම

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් පියවා ගනු ලබන මූල්‍ය වගකීම් හා සම්බන්ධ බැඳීම් සපුරාලීමේ දී සමාගම විසින් මුහුණ දෙනු ලබන අවදානම මෙය වන්නේ ය.

සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ වැඩසටහන, මූල්‍ය වෙළෙඳපළවල පුරෝකතනය කළ නොහැකි බව කෙරෙහි අවධානය යොමු කරන අතර එමගින් සමාගමේ මූල්‍ය ක්‍රියාකාරිත්වයට ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කර ගැනීමට උත්සාහ කරයි.

මගේ අංකය
எனது இல.
My No. } එච්එස්එම්/එෆ්/එස්එල්ටීසී/06/2019/02

මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2020 ජූලි ○8 දින

සභාපති

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 50 (අ) ඡේදය ප්‍රකාරව, සමාගම විසින් බිස්කට් නිෂ්පාදනය සඳහා යන්ත්‍රයක් ආනයනය කිරීමට රු.125,000,000 ක ස්ථාවර තැන්පතුවක් ඇපයට තබා ණයවර ලිපියක් විවෘත කර තිබීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 88 ඡේදය ප්‍රකාරව, සමාගම විසින් ගෙවිය යුතු ලෙස ගණනය කර තිබුණු රු.12,350,884 ක ආදායම් බදු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, සමාගමේ වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 86 ඡේදය ප්‍රකාරව, සමාගමේ ජංගම නොවන වත්කම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු යැයි ගණනය කර තිබුණු රු.2,367,537 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) 2019 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය වෙතින් සමාගම වෙත ලැබිය යුතු මුදල රු.27,625,102 ක් වන බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම අමාත්‍යාංශය විසින් සමාගම වෙත ගෙවිය යුතු මුදල රු.18,337,895 ක් පමණක් වන බව තහවුරු කර තිබුණු බැවින් අදාළ ශේෂයන් අතර රු.9,287,207 ක වෙනසක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය

විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	විස්තරය
(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 3 (අ) ඡේදය	සමාගම විසින් උපයනු ලබන බදු අයකළ හැකි ආදායම මත ආදායම් බදු වගකීම ගණනය කර ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
(i) 7.2 ඡේදය	සමාගමේ පාලන පරිසරයේ ප්‍රධාන අංශයන් ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොතක් පිළියෙල කර නොතිබුණි.
(ii) 8.2.2 ඡේදය	අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතු වුවත්, එම එකඟතාවය ලබා ගැනීමෙන් තොරව සමාගම විසින් රු.192,303,881 ක් රජයේ බැංකුවක ආයෝජනය කර තිබුණි.
(iii) 9.12 ඡේදය	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව වෛද්‍ය අරමුදලක් පිහිටුවා ක්‍රියාත්මක කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු.246,837 ක් විය.
(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 4.2.1 ඡේද	සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන විධිමත් ලෙස පිළියෙල කර නොතිබුණි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2017, 2018 හා 2019 වර්ෂ තුන තුළදී ගැබිණියන්, කිරි දෙන මව්වරුන් හා ළදරුවන්ට නොමිලයේ නිකුත් කිරීමේ අරමුණින් නිෂ්පාදනය කර තිබුණු ත්‍රිපෝෂ ප්‍රමාණය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 12,239 ක්, මෙට්‍රික් ටොන් 11,913 ක් හා මෙට්‍රික් ටොන් 11,712 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී සියයට 2.66 කින් හා 2019 වර්ෂයේදී සියයට 1.68 කින් ත්‍රිපෝෂ නිෂ්පාදනය අඩුවී තිබුණි. එසේ වුවද වාණිජ පරමාර්ථයෙන් වෙළඳපලට හඳුන්වා දී තිබුණු සුපෝෂ නිෂ්පාදනය එම වර්ෂ 03 තුළදී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 1,230 ක්, මෙට්‍රික් ටොන් 2,610 ක් හා මෙට්‍රික් ටොන් 3,717 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී සියයට 112.19 කින් හා 2019 වර්ෂයේදී සියයට 42.41 කින් සුපෝෂ නිෂ්පාදනය වැඩි වී තිබුණි. ඒ අනුව සමාජ සුභසාධන පරමාර්ථය යටපත්වී වාණිජ පරමාර්ථය ඉස්මතුවී තිබුණු බව නිරීක්ෂණය විය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

03. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සියළු අමුද්‍රව්‍ය වියදම් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය විසින් දරන බැවින්, නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවත් කරන අපතය විකුණුම් ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අපතය විකුණුම් ආදායම රු.23,849,965 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. ඒ අනුව 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ 09 ක දී රජයට අහිමිවී තිබුණු ආදායම රු.139,915,262 ක් විය.

(ආ) අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කිරිපිටි මිල්කෝ පෞද්ගලික සමාගම වෙතින් පමණක් මිලදී ගෙන තිබුණි. 2017, 2018 සහ 2019 වර්ෂවලදී කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 ක් සඳහා පිළිවෙළින් රු.810 ක්, රු.798 ක් සහ රු.800 ක් එම සමාගම වෙත ගෙවා තිබුණි. එසේ වුවද, එම වර්ෂ 03 හි දීම මිල්කෝ පෞද්ගලික සමාගම විසින් ත්‍රිපෝෂ සමාගමේ අලෙවි සැලට සමාගමේ නියෝජිතයකු මඟින් කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 ක් රු.690 කට සපයා තිබුණි. ඒ අනුව මිල්කෝ පෞද්ගලික සමාගමෙන් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 ක් රු.690 කට මිලදී ගත හැකිව තිබියදී ඒ වෙනුවට එම වර්ෂ 03 හිදී කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 කට පිළිවෙලින් රු.120 ක්, රු.108 ක් හා රු.110 ක් වැඩියෙන් ගෙවා තිබුණි. ඒ අනුව අදාළ වර්ෂවලදී වැඩියෙන් ගෙවා තිබුණු මුළු මුදල පිළිවෙලින් රු.77,760,000 ක්, රු.64,800,000 ක් සහ රු.66,000,000 ක් විය.

(ඇ) 2018/2019 කාල පරිච්ඡේදය සඳහා බඩ ඉරිහු අවශ්‍යතාවය වූ මෙට්‍රික් ටොන් 12,000 ක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනය 2018 මැයි 23 දින ආරම්භ කර, ඉන් මාස 08 කට පසුව 2019 ජනවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, බඩ ඉරිහු කිලෝ ග්‍රෑම් 1 ක් රු.55.90 බැගින් සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. 2018 මැයි 23 දින සිට 2019 ජනවාරි 22 දින දක්වා වූ මාස 08 ක කාලපරිච්ඡේදය තුළ අවස්ථා 04 කදී, බඩ ඉරිහු අවශ්‍යතාවය වූ මෙට්‍රික් ටොන් 12,000 න්, මෙට්‍රික් ටොන් 3,100 ක් රු.59.50 බැගින්ද, මෙට්‍රික් ටොන් 2,775 ක් රු.59 බැගින්ද, මෙට්‍රික් ටොන් 1,250 ක් රු.58.50 බැගින් හා මෙට්‍රික් ටොන් 1,875 ක් රු.66 බැගින්ද වශයෙන් එකතුව මෙට්‍රික් ටොන් 9,000 ක් තරඟකාරී ලංසු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි සැලසුමකට අනුව සිදු නොකිරීම හේතුවෙන් බඩ ඉරිහු මිලදී ගැනීම සඳහා වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණු මුදල රු.41,950,000 ක් විය.

(ඈ) ත්‍රිපෝෂ සහ සුපෝෂ නිෂ්පාදනය සඳහා සමාගම සතුව තිබුණු ඇන්ඩර්සන් I සහ ඇන්ඩර්සන් II යනුවෙන් වූ ඇඹරීමේ යන්ත්‍ර දෙකෙහි ධාරිතාවය පිළිවෙලින් පැයට කිලෝ ග්‍රෑම් 1,800 ක සහ පැයට කිලෝ ග්‍රෑම් 2,700 ක් විය. නමුත් ප්‍රමාණවත් සේවකයින් පිරිසක් නොසිටීම හේතුවෙන් එක් වරකට එක් යන්ත්‍රයක් පමණක් ක්‍රියාත්මක කරන බැවින් එම යන්ත්‍ර ඌන උපයෝජනය වන බව නිරීක්ෂණය විය.

(ඉ) අමුද්‍රව්‍ය තොග කළමනාකරණයට අදාළ අවම, උපරිම හා යලි ඇණවුම් තොග මට්ටම් ඇස්තමේන්තු කර නොතිබීම හේතුවෙන් අමුද්‍රව්‍ය තොග මිලදී ගැනීම්, ගබඩා කිරීම් හා නිකුත් කිරීම් විධිමත්ව සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.